# බළන්ගොඩ නගර සභාව

## 2026.06.09 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** **- බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය** **- 2026.06.09**

**වේලාව** **-පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමා |
| 2.ගරු උප සභාපති | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රුමී මැතිතුමා |
| 5.ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6.ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7.ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී ජේමදාස මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 9.ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී ජයනක මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01.පසුගිය 2026.05.12 දිනැති මහ සභාවේ සභා වාර්තාව සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව න්‍යායපත්‍රානුකූලව 2026-05-12 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.මෙහි දී ගරු උප සභාපති නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් 2026-05-12 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමන් සංශෝධන ඉදිරිපත් කරන ලෙස දැන්වූ අතර ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ 2026-05-12 දිනැති මහ සභා වාර්තාවේ පිටු අංක 48හි මුද්‍රණ දෝෂයකින් "අනතුරුව ගරු උපසභාපතිතුමා පැවසුයේ වේද නම් කිරීම් පනත යටතේ" ලෙස සටහන් වී ඇති බවත්, ඒ අනුව එය "අනතුරුව ගරු උපසභාපතිතුමා පැවසුයේ වීථි නම් කිරීම් පනත යටතේ" ලෙස සංශෝධනය විය යුතු බවත්, "අවසානයේ මැතිතුමාගේ නමෙන් තානායම් පිවිසුම් පාර නම් කිරීමේ කටයුතු ආරම්භ වී ඇති බවත්" යන්න , "අබුසාලි මැතිතුමාගේ නමෙන් තානායම් පිවිසුම් පාර නම් කිරීමේ කටයුතු ආරම්භ වී ඇති බවත්" ලෙස සංශෝධනය විය යුතු බවත්ය.

**ඒ අනුව ඉහත සංශෝනයන්ට යටත්ව 2026-05-12 දිනැති මහ සභා වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ❖ නිවේදන වාරය ආරම්භ කරමින් ගරු සභාපතිතුමා, පුස්තකාල උපදේශන කමිටුව පසුගිය 2026-06-05 දින පැවැත්වූ බවත්, එහිදී පොසොන් පොහොය වෙනුවෙන් 2026-06-26 දින ප.ව. 5.00 සිට බළන්ගොඩ සාංඝිතාරාමයේදී දන්සලක් පැවැත්වීමට තීරණය කර ඇති බවත්, පුස්තකාල පාඨක සමාජය විසින් 'බළන්ගොඩ ඓතිහාසික උරුමය' නමින් කෘතියක් 2026.06.30 වන දින පස්වරු 2:00 ට බළන්ගොඩ ගෝල්ඩන් සන්සිටි උත්සව ශාලාවේදී එළිදක්වන බවත්, එය ශ්‍රී ලංකා අමරපුර මහා නිකායේ උත්තරීතර මහා නායක අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය දර්ශනපති කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහා නායක ස්වාමීන්

වහන්සේගේ ප්‍රධාන සහභාගීත්වයෙන් පැවැත්වෙන බවත්, ඒ අනුව ඒ සඳහා සහභාගී වීමට සියළු දෙනාටම ආරාධනා කිරීමට මෙය අවස්ථාවක් කරගන්නා බවත් පවසන ලදී.

❖ පසුගිය වෙසක් උත්සවය වෙනුවෙන් වෙසක් සතියක් සංවිධානය කළ බවත්, බළන්ගොඩ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව, බළන්ගොඩ නගර සභාව, එමෙන්ම බළන්ගොඩ ප්‍රාදේශීය සභාව, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව සහ බළන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය යන රාජ්‍ය ආයතන සියල්ල එකතු වී එය පැවැත්වූ බවත්, එය සාර්ථකව ඉටු කරගැනීමට හැකියාව ලැබුන බවත්,ඒ අනුව මැයි මස 27 වෙනිදා සිට ජුනි මස 01 වෙනිදා දක්වා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ බවත්, ඒ සඳහා සභාවේ උප සභාපතිතුමා, මන්ත්‍රීතුමා ඇතුළු සියලු දෙනා සහභාගි වූ බවත්, එමෙන්ම සභාව ලෙස පිණ්ඩපාත චාරිකාව දිනයේ වැඩම කළ ස්වාමීන් වහන්සේලා සියලු දෙනාටම, මෙහෙණින් වහන්සේලා සියලු දෙනාටම දානය පිළිගැන්වීමේ වැඩසටහනක් සිදු කිරීමට හැකි වූ බවත්, එහිදී නගර සභාව විදිහට ලොකු මැදිහත්වීමක් කළ බවත්, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයට, මන්ත්‍රී මණ්ඩලයට, සියලු දෙනාම සහභාගි වී, මුදලින් දායක වී ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට උත්සුක වීම සම්බන්ධයෙන් සියලු දෙනාටම, ස්තුතිවන්ත වන බවත් ගරු සභාපතිතුමා පැවසීය.

එමෙන්ම එම සතිය පුරාවටම බළන්ගොඩ ප්‍රදේශයට කාලෙකට පස්සේ වෙසක් සතිය සමරන්න හැකියාව ලැබුණ බවත්, වෙනදා නොවුනු ආකාරයකට හැමෝම ගොඩක් සතුටු වූ බවත්, මේ සියල්ල සම්බන්ධීකරණය කරගනිමින් රාජ්‍ය ආයතන සියල්ල සම්බන්ධ කරගනිමින් ඒ වෙසක් උත්සවය උත්කර්ෂවත් අන්දමින් පවත්වන්න මැදිහත් වීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමාට ස්තුතිවන්ත වන බවත්,තවද ඒ වෙනුවෙන් දායකත්වය දැක්වූ ප්‍රාදේශීය සභාවන් දෙකටම,එහි සභාපතිතුමන්ලා,සභාවල මන්ත්‍රීතුමන්ලා සහ එම කාර්ය මණ්ඩලයන්ට ස්තුතිවන්ත වන බවත්, ඒ වගේම බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, එම ලේකම්තුමියන්ලා/තුමන්ලා ඇතුළු නිලධාරී මණ්ඩලය අපිට එතැනදී සහයෝගය දැක්වූ බවත්,ඒ වෙනුවෙන් ස්තුතිවන්ත වන බවත්, ඒ වගේම බළන්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලය, ලොකු මැදිහත්වීමක් කළ බවත්, ධර්ම දේශනා සඳහා සම්බන්ධ වෙමින්, භක්ති ගීත වැඩසටහන් සඳහා ඒ දරුවන් සම්බන්ධ කරගනිමින් ,බැති ගී වැඩසටහන්වලට කලාකරුවන් සම්බන්ධ කරගන්න ලැබුණ බවත්, ඒ වෙනුවෙන් මැදිහත් වුණ සියලු දෙනාටම ස්තුතිවන්ත වන බවත්, ඒ අනුව ඉදිරි වර්ෂවලදී මීටත් වඩා සාර්ථකව මෙක සංවිධානය වෙලා වෙසක් උත්සවය සමරන්න බලාපොරොත්තු වන බවත්, එහිදී ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම ඊළඟ වර්ෂයේත් සියලු දෙනාගෙන්ම අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

- ❖ පසුගිය ඉරිදා දින තුඹගොඩ කඩපේලියක් අලුයම පාන්දර 3:00 ට පමණ ගිනිගැනීමකට ලක් වූ බවත්, එහිදී ක්ෂණිකව මැදිහත් වී, දුරකථන ඇමතුම ලැබී විනාඩි 10 ක් වගේ අඩු කාලයක් ඇතුළත පැමිණ ක්‍රියාත්මක වී සිදු වීමට ගිය ලොකු විනාශයක් වළක්වා ගැනීමට අපේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් වන විශේෂයෙන්ම කෝසල මහත්මයා, අතුල මහත්මයා, ධනුෂ්ක මහත්මයා, ඒ වගේම නලින් මහත්මයා බවත්, එම සියලු දෙනා සම්බන්ධ වී හැකි ඉක්මනින් ක්‍රියාත්මක වෙලා එම ගින්න මැඩපවත්වන්න උත්සුක වූ බවත්, ඉතාම කෙටි කාලයක් තුළ ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් එම මැදිහත් වීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බවත්, අසල්වාසීනුත් එතැනදී මැදිහත් වෙලා ඒ ගින්න නිවන්න ගොඩක් දායක වූ බවත්, විශේෂයෙන්ම මම අපේ කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වන බවත්, මැදිහත් වූ සියලු දෙනාට, ගින්න නිවීමට, ලොකු අනතුරක් වළක්වා ගැනීමට මැදිහත් වීම සම්බන්ධයෙන් විශේෂ ස්තුතියක් කිරීමට මෙය අවස්ථාවක් කරගන්නා බවත් ගරු සභාපතිතුමා සභාව දැනුවත් කරමින් පවසන ලදී.

**03. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

මෙදින ගරු සභාවේ සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා නොවන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**04. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම.**

මෙදින ගරු සභාවේ සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම් නොවන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**05.ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම.**

මෙදින ගරු සභාවේ ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම් නොවන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**06. කල් දී ඇති ප්‍රශ්න**

**06:01 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

**06:01:01** 75,000 යෝජනා වෙනුවෙන් ලබාදුන් ඉතිරි සූර්ය විදුලි බල්බය සවිකරන්නේ කවදද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසුයේ විදුලි බල්බ සහ සවි කිරීමේ බට ගෙනවිත් තිබෙන බැවින් ඉදිරි සතිය ඇතුළත සවි කළ හැකි බව පැවසීය.

**06:01:02** 500,000 යෝජනා යටතේ ලබාදුන් සූර්ය බල්බ මිළදී ගෙන ඇත්ද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා මෙය රු.500,000 යෝජනා යටතේ ඉල්ලුම් කර ඇතිද යන්න විමසන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ රු.150,000ක සෝලා විදුලි බල්බ ඉල්ලුම් කර ඇති බවයි.අනතුරුව ගරු සභාපතිතුමා පැවසුයේ එම බල්බ ලබා දිය හැකි බවයි.

**06:01:03** 500,000 යෝජනා යටතේ ලබාදුන් සංවර්ධන යෝජනා වල ඇස්තමේන්තු සකස් කර ඇත්ද? එය ආරම්භ කළ හැක්කේ කවදාද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා මේ යටතේ අයවැය සකස් කිරීමේදී යෝජනා ලබා ගත් බවත්, සමහර යෝජනා වරින් වර වෙනස් වූ බවත්, ඒ අනුව වරින් වර වෙනස් වූ බැවින් අවසාන ලයිස්තුවක් සකසා ගැනීමට නොහැකිව සිටින බවත්, නිශ්චිතවම ලබා දී ඇති යෝජනාවල ඇස්තමේන්තු මේ වන විට සකස් කරමින් පවතින බවත්, මෙම මස තුනක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවත්, ඒ අනුව එසේ කළ යුතු යෝජනා පවතීනම් ඒ පිළිබඳ දැනුම් දෙන ලෙස මෙම අවස්ථාවේ දැනුවත් කරන බවත් පවසන ලදී.

ඒ අනුව මෙම මස ආරම්භ කිරීමට බලාපොරොත්තු වන යෝජනා මොනවාද යන්න ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ ඒ සඳහා ව්‍යාපෘති දෙකක් මේ වන විට නිශ්චිත කර ගෙන ඇති බවත්, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා එක්ව දෙදෙනාගේ රු.500,000 බැගින් යොදා රු.1,000,000 ක ව්‍යාපෘතියක් සිදු කිරීමට යෝජනා කර ඇති බවත්,එය ක්‍රියාත්මක කරන බවත්, අනෙක් ව්‍යාපෘතිය පිළිබඳව තවම නිශ්චිතව තීරණය කර නොමැති බවත්,නමුත් තව එක් ව්‍යාපෘතියක් සිදු කරන බවත්ය.

**06:01:04** මුගුණමලය මාර්ගයේ නඩත්තුව සිදුවන්නේ කවදාද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසුයේ මෙහි ඇස්තමේන්තු සකස් කර ඇති බවත්, හැකි ඉක්මනින් නඩත්තුව ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ තමන් සභාවට පැමිණි දවසේ සිටම මෙම මාර්ගය නඩත්තු කිරීමට ඇස්තමේන්තු සකස් කරන ලෙස පවසන බවත්, නමුත් ඊට පසුව ඇස්තමේන්තු කළ ඒවා මේ වන විට ආරම්භ කර ඇති බවත්, තමන් සජබයේ බැවින් මෙය ක්‍රියාත්මක නොකර සිටිනවා නම් මෙම මාර්ගයේ යන්නේ සජබයේ ජනතාව පමණක් නොවන බව පවසන බවත්, වැඩ අධිකාරී මහතාගෙන් විමසුවිට සභාපතිතුමා එය කියපු නැති නිසා නොකරන බව පැවසු බවත්, එසේ නොකර මෙය කර දෙන ලෙසත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ එහෙම දෙයක් සිදු වී නොමැති බවත්, ඡන්දයෙන් පත්කර මෙතනට ආවද හැමෝම මිනිස්සු වෙනුවෙන් වැඩ කරන බවත්, ඡන්දේ දීපු අයට යන්න කියලා අනිත් අයට උඩින් යන්න කියන්නේ නැති බවත්ය.

**06:02** ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා

**06:02:01** බලන්ගොඩ ඉරිදා සති පොළෙහි පොළ කුටියක දිනක අයකිරීම සහ සතිපොළ ආදායම වෙන වෙනම ඉදිරිපත් කරන්න.

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පහත පරිදි සතිපොළ ආදායම ඉදිරිපත් කරන ලදී.

**<u>පොළ නොපවත්වන දිනයන්හි ආදායම</u>**

| මාසය | ආදායම (රු.) |
|---|---|
| ජනවාරි | 51,600.00 |
| පෙබරවාරි | 54,840.00 |
| මාර්තු | 56,600.00 |
| අප්‍රේල් | 55,100.00 |
| මැයි | 51,000.00 |
| එකතුව | 269,140.00 |

**<u>සතිපොළ ආදායම</u>**

| මාසය | පොළ මඩු ගාස්තු (රු) | තොගමඩු හා වාහන ගාස්තු (රු) | එකතුව (රු) |
|---|---|---|---|
| ජනවාරි | 478,450.00 | 98,350.00 | 576,800.00 |
| පෙබරවාරි | 297,150.00 | 59,910.00 | 357,060.00 |
| මාර්තු | 509,250.00 | 90,700.00 | 599,950.00 |
| අප්‍රේල් | 420,350.00 | 64,030.00 | 484,380.00 |
| මැයි | 378,000.00 | 57,390.00 | 435,390.00 |
| එකතුව | | | 2,453,580.00 |

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සතියක ආදායම පිළිබඳව විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ එතුමා ඉල්ලන ආකාරයට විස්තරාත්මක තොරතුරු ඊළඟ සභාවට ලබා දිය හැකි බවයි.

**07. කල් දී ඇති යෝජනා**

**07:01 ගරු සභාපති එන්.ඩබ්.පී.ටී.ජයසේන මැතිතුමා**

**07:01:01** බළන්ගොඩ නගර සභාවට අයත් කඩ කාමරවල බදු අයිතිය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් CLG/LG/-5/3/1 – (IV වෙළුම) හා 2026.01.01 දිනැති ලිපිය අනුව අතුරු බදු ලබා දී ඇති කඩ කාමරවල බදු අයිතිය අතුරු බදුකරුගේ නමින් සංශෝධනය කර ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපි, 2026.02.25, 2026.03.10, 2026.04.07, 2026.05.12 දිනැති මහ සභාවන් වෙත යොමු කර අනුමැතිය ලබා ගෙන ඇත.

එසේ අනුමැතිය ලබාගත් අතුරු බදු දීම් පිළිබද සභා තීරණ හා බදු ගිවිසුම්පත්,දිවුරුම් ප්‍රකාශ හා ඉල්ලීම් ලිපි ආදී විස්තර බනස/ආ/07/08 හා 2026.04.27 ලිපිය මගින් පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කර ඇත. ඒ සඳහා පොදු තීරණයක් ගෙන නැවත යොමුකරන ලෙස පළාත් පාලන කොමසාරිස් දන්වා ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ඉහත යෝජනාව පිළිබඳව කරුණු පැහැදිලි කර ගැනීම වෙනුවෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා පවසන ලදුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.මෙහිදී ආදායම් අංශ ප්‍රධානී මහතා අදාළ පැහැදිලි කිරීම් සිදු කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී. එහිදී අතුරු බදු ලබා දී ඇති කඩ කාමරවල බදු අයිතිය අතුරු බදුකරුගේ නමින් සංශෝධනය කර ගැනීමට අදාළ චක්‍රලේඛයේ දින දීර්ඝ කිරීමත් සමඟ මෙලෙස වරින් වර ඉදිරිපත් වූ ඉල්ලීම් වෙනුවෙන් සභා තීරණ ලබා ගෙන ඇති බැවින් පොදු තීරණයක් ගත යුතු බවට කරුණු පැහැදිලි කර ගන්නා ලදී.

**2026.02.25 දිනැති මහ සභාවේ තීරණ අංක 07.01.07 යටතේ අනුමත වී ඇති,**

| අනු අංකය | කඩ කාමර අංකය | ගිවිසුම්ගත බදුකරුගේ නම | අතුරු බදුකරුගේ නම |
|---|---|---|---|
| 01. | පොදු වෙළෙඳසැල අංක 01 | හබකල කංකානමගේ නන්දනී අල්විස් | සුහසිංහ ආරච්චිගේ සුජීවා |
| 02. | පොදු වෙළෙඳසැල අංක 02 | හබකල කංකානමගේ නන්දනී අල්විස් | සුහසිංහ ආරච්චිගේ සුජීවා |
| 03. | පදික කඩ අංක 185/11 | පෝද්දිවෙල හේවගේ චින්තක සුසන්ත කුමාර | සිවසූරියම් අන්වීක්ෂා ධනංජනී |
| 04. | පදික කඩ අංක 185/22 | මොහිදීන් ලෙබ්බෙ හාරිදු මොහොමඩ් ෂිහාන් | කිරිකට්ටඩියලාගේ කසුන් හංස ලක්මාල් |
| 05. | කාර් පාක් අංක 04 | මස්සැන්නෙ අම්පිටියාවත්තේ කල්යාණි විජේතුංග | අලංකාරගේ චමින්ද හේමකුමාර |
| 06. | මැණික් කඩ අංක 08 | වඩුගේ වත්තේ ලූසියා | ගලගමගේ අජිත් නයනප්‍රිය ඇල්බට් |
| 07. | නව පදික කඩ 197/01/A | සුබ්‍රමනියම් චන්ද්‍රිකා | සදාසිවන් නිශාන්ති |
| 08. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක ඒ-20 | මහම්මදු ඉස්මායිල් හමීම් මහම්මදු | කඳන කංකානමලාගේ වරුණ තිලංක දිසානායක |
| 09. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-04 | අබ්දුල් රසාක් මොහොමඩ් අසීම් | අසේල චින්තක සුභාෂ් කහංගම |
| 10. | පොළ කඩ  අංක 01/A | ඉන්දිකා සංජීවනී වරකාවත්ත | කිරිය කට්ටඩියලාගේ තීක්ෂණ ජීවත්ත ලක්මාල් |
| 11. | පොළ කඩ අංක 06 | ඉන්දික එරික් සිසිල් | තෙල්ගේ දිනේෂ් කුමාර පීරිස් |
| 12. | පොළ ගබඩා අංක 185/A/2 | දෙනගම විතාරණගේ රංජිත් | මිත්‍රිගේ සුරංග මැණික් විජේතුංග |
| 13. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-06 | දෙමට හෙට්ටිගේ සරත් ප්‍රේමචන්ද්‍ර කුමාරසිරි | උෂන්ත ප්‍රිය ගුණසේකර |
| 14. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-08 | මොහොමඩ් රාසික් ෆාතිමා රිස්මියා | චන්ද්‍රමෝහන් දයාබරන් |
| 15. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-18 | නුහු මරික්කාර් මොහොමඩ් සිද්දික් | මොහොමඩ් මර්සූක් මොහොමඩ් ජවාස් |
| 16. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-19 | ක්‍රිෂ්ණන් රවීන්ද්‍ර | වියලිගොඩ විතාන ආරච්චිගේ නිමන්ත නිරෝෂන් ජයසේකර |
| 17. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක සී-10 | කඳන කංකානමලාගේ චන්ද්‍රදාස | පොන්නම්පෙරුමගේ බර්නි නදීෂා ප්‍රනාන්දු |
| 18. | මහජන පොළ කඩ අංක 11 | සෙම්බු කුට්ටිගේ එමිකා රෝෂනී ද සිල්වා | තෙලේනිස් ආරච්චිගේ දීපාල් තෙලේනිස් ආරච්චි |

**2026.03.10 දිනැති මහ සභාවේ තීරණ අංක 07.01.03 යටතේ අනුමත වී ඇති,**

| අනු අංකය | කඩ කාමර අංකය | ගිවිසුම්ගත බදුකරුගේ නම | අතුරු බදුකරුගේ නම |
|---|---|---|---|
| 19. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-29 | මොහොමඩ් අලි සික්කන්දර් | කාදර් මීරා සයිබු අමානුල්ලා |
| 20. | පදික කඩ අංක 185/07 | බමුණුසිංහ ආරච්චිලාගේ කමලා මැණිකේ | ඇල්ලෙ වත්තෙ ආරච්චිලාගේ සුජිත නිපුන් ඇල්ලෙවත්ත |
| 21. | නව පදික කඩ අංක 197/13 | උඩගංගොඩ කුඩකාරරාලලාගේ සිරිපාල | මාරසිංහ මුදියන්සේලාගේ ප්‍රසන්න ගයාන් ආනන්ද |

**2026.04.07 දිනැති මහ සභාවේ තීරණ අංක 06.01.20 යටතේ අනුමත වී ඇති,**

| අනු අංකය | කඩ කාමර අංකය | ගිවිසුම්ගත බදුකරුගේ නම | අතුරු බදුකරුගේ නම |
|---|---|---|---|
| 22. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-22 | අහමදු සලී කමර්දීන් | ෆලීල් මොහොමඩ් රිකාස් |
| 23. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක සී-45 | මොහොමඩ් මන්සූර් | මොහොමඩ් මසූද් |

**2026.05.12 දිනැති මහ සභාවේ තීරණ අංක 07.01.07 යටතේ අනුමත වී ඇති,**

| අනු අංකය | කඩ කාමර අංකය | ගිවිසුම්ගත බදුකරුගේ නම | අතුරු බදුකරුගේ නම |
|---|---|---|---|
| 24. | බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-01 | සිත්තර වේලු තුෂාන්දන් | මොහොමඩ් උවයිස් මොහොමඩ් රුමී |

ඒ අනුව බලන්ගොඩ නගර සභාව සතු ගිවිසුම් මඟින් බදු දී ඇති ඉහත දේපල ගිවිසුම්ගත බදුකරුවන් විසින් තෙවන පාර්ශවයන් වෙත අතුරු බදු දී ඇති අවස්ථාවක එකී දේපල ටෙන්ඩර් කිරීමට කටයුතු කල යුතු වුවද, එම දේපලේ බදු අයිතිය අවලංගු කර නැවත ටෙන්ඩර් කිරීම ප්‍රායෝගික නොවන බවට පෙනී යන බැවින් එම අතුරු බදු දී ඇති දේපල නියමානුකූල කර ගැනීමේ ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව එකී යෝජනාව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:02** නාගරික සංවර්ධන අධිකාරියට අයත් බිම් කොටසේ ඉදිකිරීමට නියමිත නව රථ වාහන නැවතුම්පොලෙහි යෝජිත ගාස්තු අය කිරීම පහත දක්වා ඇත.

<u>දිවා කාලයේදී (පෙ.ව 6.00 සිට ප.ව 5.59 දක්වා)</u>

1. ලොරියක්, බස් රථයක් සඳහා රු.100.00 (පළමු පැය 03 සඳහා පමණක් අදාල වේ.) පළමු පැය 03 න් පසු වැඩිවන සෑම පැය 01 ක් සඳහා ගාස්තුව රු.20.00 කි.

2. වෑන් රථයක්, ජීප් රථයක් සඳහා රු.50.00 (පළමු පැය 03 සඳහා පමණක් අදාල වේ.) පළමු පැය 03 න් පසු වැඩිවන සෑම පැය 01 ක් සඳහා ගාස්තුව රු.20.00 කි.

3. මෝටර් රථයක්/මෝටර් කාර් රථයක් සඳහා රු.50.00 (පළමු පැය 03 සඳහා පමණක් අදාල වේ.) පළමු පැය 03 න් පසු වැඩිවන සෑම පැය 01 ක් සඳහා ගාස්තුව රු.20.00 කි.

4. ත්‍රීරෝද රථයක් සඳහා රු. 30.00 (පළමු පැය 03 සඳහා පමණක් අදාල වේ.) පළමු පැය 03 න් පසු වැඩිවන සෑම පැය 01 ක් සඳහා ගාස්තුව රු.10.00 කි.

4. යතුරු පැදි සඳහා රු. 20.00 (පළමු පැය 03 සඳහා පමණක් අදාල වේ.) පළමු පැය 03 න් පසු වැඩිවන සෑම පැය 01 ක් සඳහා රු.10.00 කි.

<u>රාත්‍රී කාලයේදී (ප.ව 6.00 සිට පසුදා පෙ.ව 5.59 දක්වා)</u>

1. ලොරියක්, බස් රථයක් සඳහා රු.200.00 (පළමු පැය 03 සඳහා පමණක් අදාල වේ.) පළමු පැය 03 න් පසු වැඩිවන සෑම පැය 01 ක් සඳහා රු.40.00 කි.

2. වෑන් රථයක්, ජීප් රථයක් සඳහා රු.100.00 (පළමු පැය 03 සඳහා පමණක් අදාල වේ.) පළමු පැය 03 න් පසු වැඩිවන සෑම පැය 01 ක් සඳහා රු.40.00 කි.

3. මෝටර් රථයක්/මෝටර් කාර් රථයක් සඳහා රු.100.00 (පළමු පැය 03 සඳහා පමණක් අදාල වේ.) පළමු පැය 03 න් පසු වැඩිවන සෑම පැය 01 ක් සඳහා රු.40.00 කි.

4. ත්‍රීරෝද රථයක් සඳහා රු.60.00 (පළමු පැය 03 සඳහා පමණක් අදාල වේ.) පළමු පැය 03 න් පසු වැඩිවන සෑම පැය 01 ක් සඳහා රු.20.00 කි.

4. යතුරු පැදි සඳහා රු. 40.00 (පළමු පැය 03 සඳහා පමණක් අදාල වේ.) පළමු පැය 03 න් පසු වැඩිවන සෑම පැය 01 ක් සඳහා රු.20.00 කි.

ඒ අනුව උක්ත කොන්දේසි වෙනස් විය යුතු නම් ඒ සම්බන්ධයෙන් තීරණය කර, ඉදිරි කටයුතු සම්බන්ධයෙන් ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳව උපදෙස් හා තීරණ ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා පැවසුයේ නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමේ නව රථ ගාලේ බස් රථ පමණක් නැවැත්වීමට කලින් තීරණය කර තිබුණද බැහැර ප්‍රදේශවලින් රාජකාරී වලට පැමිණෙන ජනතාවගෙන් අනෙකුත් වාහන ද නවතා තැබීමට පහසුකම් ලබා දෙන ලෙස ඉල්ලීම් ලැබුණ බවත්,එමෙන්ම නගරයේ මාර්ගවල දීර්ඝ වේලාවක් නතර කර තබන වාහනද නිරීක්ෂණය වූ බැවින් එම සියලු කරුණු සලකා බලා වෙනත් වාහන සඳහාද නැවතුම් පහසුකම් ලබාදීමට සංශෝධනයක් ඉදිරිපත් කරන බවත්, ඒ අනුව දිවා රාත්‍රී ලෙස මෙහිදී ගාස්තු අය කිරීම් පිළිබඳව යෝජනා කර ඇති බවත්, මෙහි පහසුකම් සැපයීම යථාවත් කරමින් සිදු කරමින් පවතින බවත්, එතෙක් පසුගිය 04 වෙනිදා සිට මෙම කටයුතු මේ වන විට ආරම්භ කර ඇති බවත්, ඒ අනුව ඉහත ගාස්තු අය කිරීම් පිළිබඳව තීරණය කරන ලෙසත්, එහිදී රාත්‍රී කාලයේදී අය කරන ගාස්තු පිළිබඳව යෝජනා කර ඇති නමුත් තවම රාත්‍රී ගාල් කිරීම් පිළිබඳව ක්‍රියාත්මක වී නොමැති බවත් ඒ අනුව ඉදිරියේදී ක්‍රියාත්මක වනු ඇති බවත්ය.

මෙම රථගාල රාත්‍රි කාලයේදී පවත්වාගෙන යනු ලබන්නේ නම් එම ස්ථානයට විදුලිය අත්‍යවශ්‍ය බවත්, විදුලිබල මණ්ඩලය සමඟ සාකච්ඡා කර එම කටයුතු හැකි ඉක්මනින් සිදුකරන ලෙසත්, නිවෙස් වලට ගෙනයනවාට වඩා මෙහි නවතා තැබීම ලාභදායී බව බස් හිමියන් තමන් සමඟද පුද්ගලිකව සාකච්ඡා කළ බවත්, ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා පවසන ලදී.

මෙහිදී ගරු උපසභාපති නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ බස් රථ හිමියන් තවමත් එම ස්ථානයේ රථ ගාල ලෙසට පිළිගෙන නොමැති බවත්, ගාස්තු අය කිරීමට යාමේදී ගැටලු ඇතිවන බවත්, තවමත් මාර්ගයේ බස් රථ නවත්වන බවත් no parking පුවරු සවිකර පොලිසිය දැනුවත් කර මාර්ගවල බස් රථ නැවැත්වීම වහාම නතර කළ යුතු බවත්, එසේ නොකළහොත් සභාවේ මෙම රථගාල ආරම්භ කිරීමේ අරමුණ ඉටු නොවන බවත්ය.

ඊට පිළිතුරු ලබාදෙමින් ගරු සභාපතිතුමා පැවසුයේ පොලිසිය වෙත ලිඛිතව හා වාචිකව අදාළ දැනුවත් කිරීම් සිදුකර ඇති බවත්, ඉදිරියේදී එම කටයුතු ක්‍රියාත්මක වන බවත්ය.මේ අතර මෙහි කටයුතු දැනට ආරම්භ කර ඇත්ද යන්න ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් විමසන ලදුව, ගරු සභාපතිතුමා පැවසුයේ දැනට බස්රථ පමණක් ඇතුල් කිරීමට ආරම්භ කර ඇති බවත්, බස් රථවලින් රු.100 ක ගාස්තුවක් අය කරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය මෙහිදී සඳහන් කළේ,බස් නැවතුම්පොළෙහි පෞද්ගලික බස්රථ 176 ප්‍රමාණයක් දිනකට ගාල් වන බවත්, ඒ ඇරුණු කොට රත්නපුර ප්‍රදේශයෙන් පැමිණෙන බස් රථ 50ක් පමණ පවතින බවත්, දිනකට බස් රථ රථ 150ක පමණක් සාමාන්‍ය ගණනක් ධාවනය කළ ද එයින් ගාල් ගාස්තු ලෙස දළ වශයෙන් දිනකට රුපියල් 15,000 ක පමණ ආදායමක් ලැබෙන බවත්, එසේ ලැබී තිබියදීත් ඉහත

යෝජනාවේ දක්වා ඇති පරිදි නවතා තබන කාලසීමාව පදනම් කරගෙන අය කළහොත්, එක් අයෙකුට නගර සභාවට දිනකට රු. 3000 ක පමණ මුදලක් ගෙවීමට සිදුවන බවත්, ඒ අනුව උදේ සිට සවස වන තුරුම රු.100ක් පමණක් අය කිරීමට යෝජනා කරන බවත්, එසේම රාත්‍රියටත් ස්ථිර මුදලක් අය කරන ලෙසත්, එසේ නොමැති වුවහොත් මෙහි බස් රථ නැවැත්වීම අඩුවනු ඇති බවත්, එසේම රාත්‍රියටත් ස්ථිර මුදලක් අය කරන ලෙසත්, එසේ නොමැති වුවහොත් මෙහි බස් රථ නැවැත්වීම අඩුවනු ඇති බවත් වෙනත් ප්‍රදේශවල පවත්නා රථ ගාල්වල අවශ්‍ය පහසුකම් සියල්ලම තිබෙන බවත්, එම පහසුකම් සියල්ලම ලබාදී අදාළ ගාස්තු අයකරන බවත්, මෙහි තවම එසේ කිසිදු පහසුකමක් ලබා දී නොමැති බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුවේ එම අවශ්‍ය යටිතල පහසුකම් ලබා නොදී සිටින්නේ නැති බවත්, එම අවශ්‍ය සියළු පහසුකම් ඉදිරියේදී සකස් කරන බවත්, ටිකට් පත් මුද්‍රණය කිරීමට අවශ්‍ය බැවින් ගාස්තු පිළිබඳව තීරණය කළ යුතු බවත්, එසේම එතුමා වැඩිදුරටත් පැවසුයේ මෙම බස් නැවතුම්පොළට පැමිණෙන බස් රථවලට අමතරව පාසල් සේවා බස් රථ වැඩිපුර ප්‍රමාණයක් මොහාන් සාලිය එල්ලාවල මාවතේ නවතා තිබෙන බවත්,එසේ නම් ඉහත නතර කර තබන පැය තුනක කාලය දීර්ඝකර අය කිරීම සුදුසු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය සඳහන් කළේ නැවැත්වීමේ පැය ගණන වැඩි කිරීම නොව රු.100 ගාස්තුවක් පමණක් අයකර අවශ්‍ය පහසුකම් ලබාදී පසුව ගාස්තු සංශෝධනයක් සිදු කිරීමට කටයුතු කිරීම සුදුසු බවත්,බස් හිමියන් බස් නැවතුම් පොළේ නැවැත්වීම වෙනුවෙනුත් රු.100ක් ගෙවන බවත්, එයින් මාසයකට දළ වශයෙන් රු.350,000 පමණ ආදායමක් ලබන බවත්, එය නොලැබීම පිළිබඳව ඇත්තේ වෙනත් හේතුවක් බවත්ය.

නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු මුදල ගෙවිය යුතු බැවින් අදාළ ගාස්තුව අය කළ යුතු බවත්,ගාස්තු අඩු කළහොත් එම මුදල් ගෙවීමට නොහැකි වන බවත් ,අවශ්‍ය පහසුකම් ලබාදී නියමිත ගාස්තු අයකිරීම සුදුසු බවත්, ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලදී. අනතුරුව ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත යෝජනාවේ ඉදිරිපත් කර ඇත්තේ යෝජිත ගාස්තුවක් පමණක් බවත් සාකච්ඡා කර ගාස්තු පිළිබඳව තීරණය කරන ලෙසත්ය.

ඉහත යෝජනා කර ඇති ගාස්තුවලට අනුව දිනක් පුරා බස් රථය නවත්වා තැබුවද ගෙවීමට සිදුවන්නේ රු.280ක පමණ මුදලක් බවත්, ඒ අනුව මෙම ගාස්තු ක්‍රමවේදයේ ගැටලුවක් නොවන බවත්, මුළු දවස පුරා බස් රථ ගාල්කර තබන්නේ නැති බවත්, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පවසන ලදී.මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු මුදල පිළිබඳව විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුවේ මසකට රු.90,000ක පමණ මුදලක් ගෙවීමට සිදුවන

බවයි. අනතුරුව ගරු නාගරික මන්ත්‍රී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය නැවතත් පැවසුවේ තමන් යෝජනා කරන්නේ උදේ 6 සිට හවස 6 දක්වා රු.100 ගාස්තුවක් අය කරන ලෙස බවයි.

උදේ 6.00 සිට සවස 6.00 තෙක් රු.100 ගාස්තුවක් අයකර සවස 6.00 සිට උදේ 6.00 දක්වා වෙනත් ගාස්තුවක් අය කිරීම සුදුසු බවත්, එවිට බස්රථ හිමියන් එයට හුරු වන බවත් පසුව ඉහත මන්ත්‍රීතුමිය දැක්වූ ආකාරයට අවශ්‍ය පහසුකම් ලබා දී ගාස්තු සංශෝධනයන් සිදුකළ හැකිබවත්, ඒ අතර මීට අදාලව පොලිසියෙන් සිදු විය යුතු වැඩ කොටසක්ද පවතින බවත්, අය කරන මුදල වැඩි වුවහොත් බස් රථ ඇතුල් නොකර සිටීමට පෙළඹෙන බවත්, එබැවින් රු.100 මුදල අයකර ක්‍රම ක්‍රමයෙන් එයට හුරු කරගත යුතු බවත්, ගරු නාගරික මන්ත්‍රී ජී ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා සඳහන් කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සඳහන් කරේ දිනක් පුරා රු.100ක ගාස්තුවක් අය කිරීම සුදුසු බවත්, අයකරන මුදල වැඩිවුවහොත් බස් රථ ගාල් නොකර සිටීමට පෙළඹෙන බවත්, එසේ වුවහොත් ලැබෙන රු.100 ආදායම වත් නොලැබෙන බවත්ය.මෙහිදී පොලිසියට විශාල කාර්යභාරයක් පවතින බවත්, බයිපාස් මාර්ගවල වාහන නතර කිරීම තහනම් බවත්, නගරයට පැමිණෙන පාසල් බස් රථ සියල්ලම බයිපාස් මාර්ගයේ නතර කර තිබෙන බවත්, මෙම බස් රථ අනිවාර්යයෙන්ම රථ ගාල තුළට දමාගත යුතු බවත්, ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කරන ලදී.

මේ පිළිබඳව මේ වන විට පොලිසිය දැනුවත් කර ඇති බව ගරු සභාපතිතුමා පැවසූ අතර, ගරු නාගරික මන්ත්‍රී එන්.ජී.එස් චන්දන මැතිතුමා සඳහන් කළේ ඉහත යෝජනාවට අදාළව ගාස්තුව තීරණය කළ යුත්තේ නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු මාසික ගාස්තුවත් අය කරගෙන සේවක වැටුපද ඇතුළත්ව බවත්, මෙය කාරක සභා අවස්ථාවක් කර ඉහත යෝජනාව සඳහා පාදක වූ දත්ත පවතී නම් ඒ පිළිබඳව අදාළ පැහැදිලි කිරීම් ලබාගත යුතු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ නාගරික සංවර්ධන අධිකාරියට ගෙවන මුදල, සේවක වැටුප සපයනු ලබන යටිතල පහසුකම්වලට යන පිරිවැය ආදී සියල්ලම ඉහත ගාස්තුව මඟින් ආවරණය විය යුතු බවයි.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා සඳහන් කළේ මාර්ගයේ වැඩිපුරම නතර කර තිබෙන්නේ පාසල් බස් රථ බැවින් බස් රථ 30-50 පමණ දැමීමට හැකියාව පවතින බවත්, ඒ අනුව ඉහත ක්‍රමවේදය අනුව ගාස්තු අයකිරීම සාධාරණ බවත්, එසේ නොවුවොත් මෙහි පිරිවැය ආවරණය කරගැනීමට හැකියාව නොලැබෙනු ඇති බවත්ය.

මේ සඳහා අත්‍යවශ්‍ය වැසිකිලි සහ අනෙකුත් යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම් ප්‍රමාද වන්නේ ඇයිද යන්න ගරු නාගරික මන්ත්‍රී එච්.ජී.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විමසන

ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ එම යටිතල පහසුකම් ද සමඟ මුරකුටියක්ද සකස් කළ යුතු බවත් එම කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතින බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා සඳහන් කලේ පාසල් බස් රථ හැරුණු කොට පවතින්නේ රත්නපුර බලන්ගොඩ ධාවනය කරන බස් රථ බවත්, එම බස්රථ හිමියන්ට ඒවා නිවෙස් වලට ගෙන යනවට වඩා මෙහි නතර කිරීම වඩා ලාභදායී බැවින් ගාස්තු අය කිරීමේදී ඉතා වැඩි මුදලක් අය කළහොත් එසේ රඳවා තැබීමෙන් වළකිනු ඇති බවත්ය.ගරු සභාපතිතුමා පැවසුයේ රාත්‍රී කාලයේදී බස් රථ නැවැත්වීම සිදුකරන්නේ නම් එහිදී මීට වඩා ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් විය යුතු බැවින් දැනට මිල ගණන් ස්ථාවර කිරීම පමණක් සිදුකරගෙන එය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීම සුදුසු බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමන් සඳහන් කලේ ඉහත තරංගනී මන්ත්‍රීතුමිය පැවසූ පරිදි රු.100 ගාස්තුව සාධාරණ ගාස්තුවක් බවට පෙනී යන බැවින් එම මුදල අය කිරීම සුදුසු බවත්, ඉදිරියේදී සියලු පහසුකම් ලබා දී අවස්ථාව අනුව වෙනස් කිරීම සුදුසු බවත්ය.

ගරු උපසභාපති නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ ඉහත තරංගනී මන්ත්‍රීතුමියගේ යෝජනාව සුදුසු බවත්, පළමුව මෙම රථ ගාල සිදුකිරීම පිළිබඳව නියාමනයක් සිදු කළ යුතු බවත්, එහිදී ආදායම් උත්පාදනය වන ආකාරය පිළිබඳව සලකා බලා අවශ්‍ය වෙනස් කිරීම් ඉදිරියේදී සිදු කළ හැකි බවත්, දැනට මෙය ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික යෝජනාවක් ලෙස ඉහත නදීක මන්ත්‍රීතුමා සහ තරංගනී මන්ත්‍රීතුමිය පැවසූ පරිදි එම යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, යටිතල පහසුකම් සංවර්ධනයන් සිදුකර ගාස්තු වැඩි කිරීම සුදුසු බවට තමන් යෝජනා කරන බවත්ය.

අවසානයේ ගරු සභාපතිතුමා විසින් නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමෙහි නව රථගාලේ යටිතල පහසුකම් සකස් කරන තෙක් පහත ගාස්තු අය කිරීම සුදුසු බවටත්, එම රථ ගාල සඳහා අවශ්‍ය පහසුකම් සියල්ල ලබාදුන් පසු නැවත වරක් ගාස්තු සංශෝධනයක් සිදුකිරීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

<u>දිවා කාලයේදී (පෙ.ව 6.00 සිට ප.ව 5.59 දක්වා)</u>

- ලොරියක්, බස් රථයක් සඳහා රු.100.00
- වෑන් රථයක්, ජීප් රථයක් සඳහා රු.50.00
- මෝටර් රථයක්/මෝටර් කාර් රථයක් සඳහා රු.50.00
- ත්‍රීරෝද රථයක් සඳහා රු. 30.00
- යතුරු පැදි සඳහා රු. 20.00

<u>රාත්‍රී කාලයේදී (ප.ව 6.00 සිට පසුදා පෙ.ව 5.59 දක්වා)</u>

- ලොරියක්, බස් රථයක් සඳහා රු.200.00
- වෑන් රථයක්, ජීප් රථයක් සඳහා රු.100.00
- මෝටර් රථයක්/මෝටර් කාර් රථයක් සඳහා රු.100.00
- ත්‍රිරෝද රථයක් සඳහා රු.60.00
- යතුරු පැදි සඳහා රු. 40.00

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් මුදල් සම්බන්ධව යම්කිසි කාරණයකට යටත්වෙලා අයකරගැනීමක් සිදු වූ පුද්ගලයෙකු මෙම රථගාලේ රාජකාරි සඳහා යොදවා ඇති බවත්, එවැනි අයෙකු මුදල් සම්බන්ධ රාජකාරී සඳහා යෙදවීමක් සිදු කළ හැකිද යන්න පිළිබඳව තමන් නොදන්නා බවත්,එසේ යෙදවිය හැකිද යන්නත් විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ කුමන හෝ ගැටළුවකට එසේ වී ඇති වුවද කෙනෙකු එලෙස හම්වඩු ගැසීම සුදුසු නොවන බවත්, ඒ සම්බන්ධව අධීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන බවත්ය.

ඉහත සඳහන් කරන ආකාරයේ කරුණු සඳහා පිළිතුරක් ලෙස ටිකට්පත් ලබා දීම සඳහා මැෂින් ලබාගත හැකි බවත්, එම කටයුතු ප්‍රමාදවන්නේ ඇයිද යන්නත් ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ ටිකට්පත් වල ඇතුළත්විය යුතු මිල ගණන් එම ආයතනය විසින් විමසීම් කරන බැවින් මෙම සභා යෝජනාවෙන් පසු ඊට අදාළ තොරතුරු ලබා දිය හැකි බවයි.

**07:01:03** බළන්ගොඩ බස්නැවතුම්පොළ ගොඩනැගිල්ලේ දුර බැහැරින් පැමිණෙන මඟී ජනතාවගේ විඩාව නිවාගැනීමට ආසන පහසුකම් ඉල්ලීම් කිරීම සම්බන්ධව වැලිපතයාය, කොන්ගහමංකඩ, සඳකිරණ වැඩිහිටි සංවිධානයේ සභාපති කේ. ඩී කුලරත්න මහතා යොමු කර ඇති ලිපිය සම්බන්ධ ඉදිරි කටයුතු තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත නම සඳහන් වැඩිහිටි සංවිධානයේ සභාපතිතුමා විසින් ජනාධිපති ලේකම් කාර්යාලය වෙතද ඉල්ලීම් යොමු කර ඇති බවත්, ඒ අනුව අදාළ කටයුතු පිළිබඳව සලකා බලන ලෙස සභාව වෙත දන්වා ඇති බවත්, ඒ අනුව එම ඉල්ලීමට අදාලව

එසේ පහසුකමක් ලබා දිය හැකිද එය අවභාවිතා විය හැකිද යන පිළිබඳව තීරණය කිරීම උදෙසා ඉහත යෝජනාව යොමු කර ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පැවසුයේ හිටපු සභාපති, කේ.ජී පේමදාස මැතිතුමාගේ කාලයේදීත් මෙම යෝජනාව පිළිබඳව සාකච්ඡා වූ බවත්, එහිදී වෙන වෙනම සවිකල හැකි පුටු සවිකිරීම සුදුසු බවට සාකච්ඡා වූ බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා පැවසුයේ ආසන පහසුකම් ලබාදීමේ දී වෙන වෙනම සවිකල හැකි පුටු ලබාදීමට හේතුව වන්නේ යාචකයන් බවයි.ගරු සභාපතිතුමා පැවසුවේ උඩුමහලේ එසේ සවිකර ඇති පුටු පවතින බවත් නමුත් මෙහිදී ඉල්ලුම් කරන්නේ පහළ තට්ටුවේ බවත්ය.

පසුගිය දිනක බස් නැවතුම්පොළේ තරුණ පිරිසක් විසින් උඩුමහලේ ඉතා අලංකාරව තීන්ත ආලේප කර ධර්ම දේශනයක්ද පැවැත්වූ බවත්, නමුත් දැනට එය විටකෙළ ගසා නැවත අපවිත්‍ර කර ඇති බවත්, අනිවාර්යයෙන් cctv කැමරා සවිකළ යුතු බවත්, ඒ හරහා මෙවැනි දේ සිදු කරන අයට දඬුවම් ලබා දිය හැකි ක්‍රමවේදයක් සකස් කළ යුතු බවත්, ඒ අනුව බස් නැවතුම්පොලේ cctv කැමරා සවිකිරීමේ කටයුතු සිදුකිරීමට යෝජනා කරන බවත්, ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බණ්ඩාර මැතිතුමා විසින් පවසන ලදී.

ඒ සඳහා පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසුවේ cctv කැමරා සවිකිරීමේ නොහැකියාවක් නොමැති නමුත් බස්නැවතුම්පල ආවරණය කිරීමට cctv විශාල ප්‍රමාණයක් සවිකළ යුතු බැවින් ඒ පිළිබඳව ඉදිරියේදී සලකා බැලිය යුතු බවයි.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා සඳහන් කළේ බස් නැවතුම්පොළ සඳහා කලින් පොලිස් නිලධාරීන් සම්බන්ධ වී ආරක්ෂාව ලබා දුන් බවත්, නමුත් එය වර්තමානයේ ක්‍රියාත්මක නොවන බවත්ය. සභාපතිතුමා පැවසුයේ මෙම දිනවල පවතින පොලිස් නිලධාරීන්ගේ හිඟය හේතුවෙන් බස් නැවතුම්පල සඳහා යෙදවීමට නිලධාරීන් නොමැති බව පොලිසියෙන් පැවසූ බවත් ඒ සඳහා අලුතෙන් නිලධාරීන් බඳවා ගැනීමෙන් අනතුරුව එයට යොදවනු ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ප්‍රේමදාස මැතිතුමා විසින් බස් නැවතුම්පොළේ පහළ තට්ටුවේ යකඩ බට තමා සවිකල හැකි ප්ලාස්ටික් පුටු සවිකිරීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු සභාපතිතුමන් විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.අනතුරුව ගරු සභාපතිතුමන් විසින් වැඩ අධිකාරී මහතා වෙත එහි සක්‍යතාව පිළිබඳව බලන ලෙස පැවසූ අතර මේ සඳහා සිංහ සමාජයේ අනුග්‍රහය ලබා ගැනීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලදී.

**07:01:04** 2026 වර්ෂයේ සති පොලේ පොල මඩුවක පොල පැවැත්වෙන එක් දිනක් සඳහා කරනු ලබන ගාස්තුව රු.350.00 ක් ලෙස 2026 වර්ෂයේ ගැසට් නිවේදනයට අතුලත් කිරීම සඳහා 2025.10.27 දින අංක 07.01.10 යටතේ ගරු සභා තිරණය ලබාදී ඇති අතර 2026 ජනවාරි මස සිට පොල මඩුවකින් පොල පවත්වන දිනක් සඳහා අය කරනු ලබන ගාස්තුව රු.350.00 කි.

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෙම සභාව වෙත යොමු කරන ලද 2025.12.17 දිනැති ලිපිය මගින් පොල මඩුවක සතිපොල පැවැත්වෙන දිනක ගාස්තුව ලෙස රු.450.00ක් අය කල යුතු බවට සඳහන්කර ඇති අතර 2025.12.30 දිනැති විශේෂ මහ සභාවේ තීරණ අංක 02 යටතේ මහජන පොල මඩුවක් සඳහා දිනක ගාස්තුව ගැසට් නිවේදනයේ සඳහන් ගාස්තුව වන රු.350.00 ක මුදල අයකිරීමට තීරණයකර ඇත.

එසේම තක්සේරු දෙපාර්මේන්තුවේ 2025.12.17 දිනැති ලිපියේ සඳහන් රු450. 00 ගාස්තුව රු. 350.00 ලෙසට සංශෝධනය කරදෙන ලෙස 2026.01.12 දින දන්වා යැවුවද මෙතෙක් සංශෝධනයක් ලබාදී නොමැත.එබැවින් තක්සේරු දෙපාර්මේන්තුව විසින් ලබාදී ඇති 2025.12.17 දිනැති ලිපියේ සඳහන් රු 450. 00 ක ගාස්තුව අයකර අයකරගැනීම සඳහා ගරු සභාවේ අනුමැතිය ලබාගැනීම.

**ඉහත යෝජනාව සම්බන්ධව ලේකම් /විෂය නිලධාරී නිර්දේශය-**

සභා තීරණයක් මත පොළ මඩුවකින් රු.350.00ක මුදලක් අයකලද තක්සේරුව අනුව රු.450.00ක් වේ.සභා තීරණය මත තක්සේරුව සංශෝධනය සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලීම සඳහාද මෙතෙක් කිසිඳු ප්‍රතිචාරයක් නොමැත.තක්සේරු කරන ලද මුදලක් අඩුකිරීම බොහෝවිට තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් සිදු නොකරනු ලැබේ.මෙසේ රු.350.00ක මුදල තවදුරටත් අයකිරීම තුළ සභාවට සිදුවන මූල්‍යමය අලාභය විගණනය විය හැකි බැවින් රු.450.00 ක මුදල අයකිරීම සිදු කළ යුතුය.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව ජනවාරි මස යොමු කරන ලද ලිපියට මෙතෙක් පිළිතුරක් ලැබුණේ නැද්ද යන්න පිළිබඳව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ මෙතෙක් පිළිතුරක් ලැබී නමැති බවත්, එසේ තක්සේරු කරන ලද මුදලක් සාමාන්‍යයෙන් නැවත අඩු කිරීමක් සිදු නොකරන බවත්ය.පොළ මඩු වලින් අය කිරීමට යෝජිත රු.450 මුදල පොලේ සියලුම මඩුවලින්ද යන්න පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා විමසූ අතර එසේ

පොල පිටුපසට ඇති මඩු වලින්ද රු. 450ක මුදල අය කිරීමෙන් අසාධාරණයක් සිදුවන බවත් එතුමා පවසන ලදී.

මෙම අවස්ථාවේදී ඉහත යෝජනාව පිළිබඳව තොරතුරු දැනගැනීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කරන ලදී.

මෙහිදී කාරක සභාවේදී සාකච්ඡා කරගත් කරුණු අනුව පොළ මඩුවක ගාස්තුව රු.450ක් අයකිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව පොලේ තොග මඩුවෙන් ගාස්තු අය කිරීම් පිළිබඳව කාරක සභා අවස්ථාවේදී සාකච්ඡා වූ බැවින් ඒ පිළිබඳව තීරණය කරන ලෙස ගරු සභාපතිතුමා දන්වන ලදුව තොග මඩුවේ ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් කලින් ලබාගෙන ඇති කමිටු තීරණය අවලංගු කර අද දින සභාවේ ලබාගන්නා තීරණය හෙට සිටම ක්‍රියාත්මක විය යුතු බව ගරු උපසභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා පැවසුයේ පොළ පිටුපස වෙළෙඳුන්ගෙන් රු.450ක මුදලක් අය කිරීම අසාධාරණ බවයි. මෙම අවස්ථාවේ ගරු සභාපතිතුමා පොලේ තොග මඩුවේ පවත්නා කොටස් 12 සතියේ දින හතම ලබා දී එක් කොටසකට රු. 450ක් අය කිරීම සුදුසු බව පැවසූ අතර ගරු උපසභාපති නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ එම කොටස් 12 වෙළෙන්දන් 12 දෙනකුට ලබාදීමට තමන් යෝජනා කරන බවයි.එතුමා වැඩිදුරටත් පැවසුයේ එක් අයකුට පමණක් එම භූමිය ලබාදීම අසාධාරණ බවත් ඕනෑ තරම් පදික වෙළඳුන් සිටින බැවින් 12 දෙනෙකුට කොටස් 12 ලබා දිය යුතු බවයි.

එම තොග මඩුවේ වෙළඳාමක් පවතින බැවින්ද, විදුලිය ජලය ලබාදීම මෙන්ම කසළ එකතු කිරීමද සභාව මඟින් සිදු කරන බැවින් එහි කොටසකින් රු. 600ක මුදලක් අය කිරීමට යෝජනා කරන බව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පවසන ලදී.පසුව ගරු සභාපතිතුමා පැවසුවේ දැනට එම තොග මඩුවේ එක් කොටසකින් අය කරනු ලබන්නේ රු.200 ක මුදලක් බැවින් රු. 450ක මුදල අය කිරීම සුදුසු බවත්, රු.600ක මුදලක් අයකිරීමෙන් අසාධාරණයක් සිදුවන බවත්ය.

ඒ අනුව ඉහත කරුණු අනුව පොළ මඩුවක ගාස්තුව රු.450ක් අයකිරීම සඳහා වන සංශෝධිත යෝජනාව විරෝධතා නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**07:01:05** ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරුව්‍යවස්ථාව සහ දැන්වීම් පුවරු වෙනත් තාවකාලික නිර්මාණ හා සැරසිලිකටයුතු පවත්වාගෙන යාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පැවසූයේ මෙම අතුරු ව්‍යවස්ථා පිළිබඳව ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා ගෙන්වා සාකච්ඡාවක් පැවති බවත්, එහිදී

- ❖ බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය,විධිමත් කිරීම හා පාලනය කිරීම පිළිබඳ අතුරුව්‍යවස්ථා කෙටුම්පත
- ❖ බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ දැන්වීම් පුවරු, වෙනත් තාවකාලික නිර්මාණ හා සැරසිලි කටයුතු පවත්වාගෙනයාම සම්බන්ධයෙන් වන අතුරුව්‍යවස්ථා කෙටුම්පත

පිළිබඳව සාකච්ඡා වූ බවත්, මෙය පළාත් පාලන ආයතන වලට පොදුවේ ඒවා ඇති බවත්, ඒ අනුව එම අතුරු ව්‍යවස්ථාව වැළඳගැනීමට සම්බන්ධව සභා අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය බවත්ය. මෙහිදී ම ඉහත අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් පිළිබඳව අංශ ප්‍රධානී මගින් කරුණු පැහැදිලි කරගැනීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී. ඒ අනුව ඉහත අතුරු ව්‍යවස්ථා දෙක පිළිබඳවම ආදායම් අංශ ප්‍රධානී මගින් කරුණු පැහැදිලි කර කරගන්නා ලද අතර ලේකම්තුමියද අදාළ කරුණු පැහැදිලි කරන ලදී. ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කරන ලදී.

ඒ අනුව ඉහත අතුරු ව්‍යවස්ථා සභාව වෙත වැළඳ ගැනීම සුදුසු බවට ගරු සභාවේ විරුද්ධත්වයක් නොමැති බැවින් ඒකමතිකව සම්මත විය.

**07:01:06** රිෂානා ජෙම්ස් මාර්ගය හා කාණු පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා වූ සංශෝධිත ඇස්තමේන්තුව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත රිෂානා ජෙම්ස් මාර්ගය හා කාණු පද්ධතිය සංවර්ධනය කිරීමට අදාළව ඇස්තමේන්තුව ලෙස රු.5,410,000ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති බැවින් එය

සභාඅරමුදලින් සිදුකිරීමේ මුල්‍යමය හැකියාවක් නොමැති බැවින් පළාත් සභා පරිපූරක ඇස්තමේන්තුව මගින් මුදල් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම වෙනුවෙන් රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා වෙත ඉදිරිපත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදී.ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසූයේ එතෙක් මුදල් කමිටුවෙන් අනුමත වී ඇති අළුත්වැඩියාව සිදුකරන ලෙසයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පැවසුවේ තමන් පසුගිය දිනක එම මාර්ගයේ ගමන් කළ බවත් එහිදී මර්සූක් මහතාගේ නිවස අසල බිත්ති මුල්ල කඩා බැමම සැදිය යුතු බවට නිරීක්ෂණය වූ බවත්,එසේ එම මාර්ගය සැදුවේ නැත්නම් වැඩක් නැති බවත්ය.

**07:01:07** 2026 වර්ෂ සඳහා අනුමත කරන ලද කාර්යාල ප්‍රසම්පාදන කමිටුවෙහි දෙවන සාමාජික ලෙස අනුමත කර ඇති සී.ජී.ඒ.සී.හේමපාල මහත්මිය වෙනුවට 2026/04/07 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජී.ඩී.ඒ.සේමපාල මහත්මිය පත්කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:08** පහත නම් සඳහන් ශිෂ්‍යාවන් විසින් අප ආයතනයේ ප්‍රායෝගික පුහුණුවක් ලබා ගැනීමේ අවස්ථාව ඉල්ලා සිටින අතර අදාල පුහුණුවීම් 2026/06/10 දින සිට ලබාගැනීම සඳහා වන සභා අනුමැතිය ලබා ගැනීම.

| නම | ලිපිනය | ජා.හැ.අං. | විශ්ව විද්‍යාලය | අවශ්‍ය පුහුණුව | කාල සීමාව |
|---|---|---|---|---|---|
| යු.එම්.අවන්ති ඉසුරිකා නිලුක්ෂි | 112/6 ඒ දෙණියකුඹුර,රාස්සගල පාර,බලන්ගොඩ | 200175502568 | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය | තොරතුරු තාක්ෂණය සම්බන්ධව | මාස 03 |
| ඒ.එස්.එම්.ගුණසේකර | 4 කණුව ,විකිළිය,බලන්ගොඩ | 200054104305 | සබරගමුව විශ්ව විද්‍යාලය ( විශ්ව විද්‍යාල පණත යටතේ ලියාපදිංචි) | මුල්‍ය කටයුතු පිළිබඳ | මාස 06 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:09** අක්කර 18 මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තය ඉටු කිරිම සඳහා 2025.12.30 දිනැති විශේෂ මහා සභාවේ තීරණ අංක 04.2 යටතේ තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට යෝජනා වු අතර ,2026.01.26 දිනැති මහා සභාවේ තීරණ අංක 01 යටතේ ඕකේ කන්ස්ට්‍රක්ෂන් ආයතනය සුදුසු ලංසුකරු ලෙස පිළිගැනිමට තීරණය කරන ලදී.

ඒ අනුව අංක බනස/ක/06/03/18/25 හා 2026.02.11 දිනැති ලිපිය මගින් ඕකේ ක්න්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත කර්මාන්තය පිරිනැමීම දන්වා යවා ඇති අතර රු.354,100.00 වු කාර්ය සංසිද්ධි ඇපකරය 2026.02.26 දිනට පෙර ඉදිරිපත් කර ගිවිසුම් අත්සන් කරන ලෙස දන්වා ඇත.

එකී ආයතනය විසින් 2026.02.19 දිනැතිව කාර්යය සංසිද්ධි ඇපකරය සභාව වෙත ඉදිරිපත් කර ඇත.කර්මාන්ත ගිවිසුම අත්සන් කරන ලෙස 2026.02.23 දිනැතිව ලිපියක් කොන්ත්‍රාත්කරු වෙත දන්වා ඇති නමුත් කොන්ත්‍රාත්කරු කර්මාන්ත ගිවිසුම අත්සන් කිරිමට අපොහොසත් විය.

මෙකී කාලය තුළ වෙළඳපල තුළ ඇති වූ භාණ්ඩ මිල උච්චාවචනය වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් එකඟ වූ මිල ගණන් යටතේ කර්මාන්තය ඉටු කිරීමේ හැකියාවක් නොමැති බව දන්වමින් හා මිල වැඩිවීම් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. ඒ අනුව පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් එකී මිල ගණන් ලබා දීමේ හැකියාවක් නොමැති බව දන්වා ඇත.ඒ අනුව 2026.05.20 දිනැති ලිපිය මගින් 2026.05.26 දිනට පෙර එකඟවූ මිල ගණන් යටතේ කර්මාන්තයේ වැඩ ආරම්භ කරන ලෙස දන්වන ලදී.

එකී ලිපියට අනුව කොන්ත්‍රාත්කරු විසින් 2026.05.24 දිනැතිව හා 2026.05.29 දින සභාව වෙත ඉදිරිපත් කරන ලද ලිපිය මගින් කර්මාන්තය ඉටු කිරීමේ හැකියාවක් නොමැති බව දන්වා ඇත.ඒ අනුව,

01.ලංසු බැදුම්කරය සභා ගිණුමට බැර කිරීම

02.ලංසුකරු අසාදුලේඛනගත කිරීම

03.ඉදිරි ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග යන කරුණු සම්බන්ධයෙන් සභා තීරණයක් ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ඉහත යෝජනාව පිළිබඳ අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පැවසුයේ එම කර්මාන්තය සිදුකිරීමට නොහැකි බව දන්වා කොන්ත්‍රාත්කරු විසින් ලිපියක් යොමු කර ඇති බැවින් ඉහත තීරණ ගත යුතු බවයි. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පැවසුයේ ඉහත යෝජනාව පරිදි කොන්ත්‍රාත්කරු අසාදු ලේඛනගත කරන්නේ බළන්ගොඩ නගර සභාවේ පමණක්ද එසේ නොමැති නම් රත්නපුර දිස්ත්‍රික්කයේද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුවේ බළන්ගොඩ නගර සභාවේ පමණක් බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා ඊළඟට සිටින කොන්ත්‍රාත්කරුගෙන් විමසීම පිළිබඳව ගරු සභාපතිතුමාගෙන් විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුවේ දෙවැනි කොන්ත්‍රාත්කරු වන SDC අයතනයෙන් වාචිකව විමසීම් කළ බවත්, ඒ අනුව ඔවුන්ද එය සිදුකළ නොහැකි බවට ප්‍රකාශ කළ බවත්, අක්කර 18 මාර්ගයේ බෝක්කුවක් සහිතව සංවර්ධනය කිරීමට පසුව තීරණය කළ බවත්, එහිදී මිලියන 16.5 ක ඇස්තමේන්තුවක් යටතේ සිදු කිරීමට ඇස්තමේන්තු සකස් කර බවත්, එය යෝජනා කර ඒ අනුව දැනට මෙය පරිපූරක ඇත්තමේන්තුව මගින් අනුමත වී ඇති බවත්,ඒ අනුව ඉදිරියේදී නැවත අලුතින්ම ටෙන්ඩර් කර නව ටෙන්ඩර්කරුවෙකුට ලබාදී ව්‍යාපෘතිය සිදු කළ හැකි බවත්ය.

මෙහිදී මේ සඳහා රජයෙන් වෙන් වුන රුපියල් මිලියන 90ක ප්‍රතිපාදිත මුදල පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් විමසන ලදුව,ගරු සභාපතිතුමා සඳහන් කළේ එම මුදල වෙනත් ව්‍යාපෘතියක් සඳහා යොදාගනු ලබන බවයි. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ මේ සඳහා බලන්ගොඩ නගර සභාවේ රු 3.5ක මුදලක් වෙන්කළ බවත්, ඒ අනුව නගර සභාවේ මුදල් මේ සඳහා වැය වන්නේද යන්නත් විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුවේ සභා අරමුදල් මේ සඳහා වැයවීමක් සිදු නොවන බවයි.මේ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පැවසුයේ එම මාර්ගයේ සවිකර ඇති පුවරුව ගලවා ඉවත් කිරීමට සිදුවන බවයි.

ඒ අනුව අක්කර 18 මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ කොන්ත්‍රාත්කරු වන ඕකේ කන්ස්ට්‍රක්ෂන් විසින් 2026.05.24 දිනැතිව හා 2026.05.29 දින සභාව වෙත ඉදිරිපත් කරන ලද ලිපිය මගින් කර්මාන්තය ඉටු කිරීමේ හැකියාවක් නොමැති බව දන්වා ඇති බැවින් ලංසු බැදුම්කරය සභා ගිණුමට බැර කිරීම, ලංසුකරු අසාදුලේඛනගත කිරීම යන ඉහත යෝජනාව සඳහා ගරු සභාවේ විරෝධතා නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**07:01:10** අනවසරයන් පවත්වාගෙන යනු ලබන මෘත දේහ තැන්පත් කර තබන හා ප්‍රදර්ශනය කරන ගොඩනැගිල්ලක් සම්බන්ධ පරිපාලන කටයුතු පිළිබද පාර්ලිමේන්තු කොමසාරිස් අංක OMB/P/2/9/1754/2026 හා 2026.05.07 දිනැති ලිපිය මගින් යූ. එම්. පියුමි අරුණෝදාා යන අය විසින් අංක 438, ඕළුගංතොට, බළන්ගොඩ යන ස්ථානයේ ඉදිකර ඇති මෘත දේහ තැම්පත් කිරීම සහ ප්‍රදර්ශනය කරන ස්ථානය සම්බන්ධ වාර්ථාවක් ලබා දෙන ලෙස දන්වා ඇත.

මෙම ඉදි කිරීම අනවසර වන අතර, ඒ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට 2026.05.27 දිනැති සැලසුම් කමිටුවේදී තීරණය විය. තවද මෙම ව්‍යාපාරයට අදාළ ව්‍යාපාර බලපත්‍ර පිළිබදවත් මෙම අනවසර ඉදි කිරීම සම්බන්ධ ගැටළුව පිළිබදවත් සාකච්ඡා කිරීමට 2026.06.09 දින බළන්ගොඩ නගර සභාවේ මහ සභාව වෙත ඉදිරිපත් කිරීමට 2026.05.27 දිනැති සැලසුම් කමිටුවේදී තීරණය විය.ඒ අනුව අදාළ උපදෙස් සහ ඉදිරි කටයුතු සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ ගම්වාසීන් පිරිසක් විසින් ඔම්බුඩ්ස්මන් වරයා වෙත යොමු කරන ලද පැමිණිල්ලකට අදාළව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කාර්යාලය මඟින් සභාවෙන් ඉහත විමසීම් සිදුකර ඇති බවත් ඕලුගන්තොට ජයතුංග මල්ශාලාවේ මෘත දේහ ප්‍රදර්ශනය කරනු ලබන කොටස පිළිබඳව ඉහත පරිදි විමසීම් කර ඇති බවත්ය.

එම ඉදිකිරීම සඳහා සභාවේ අනුමැතියක් තිබේද යන්න පිළිබඳව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසූයේ ඉදිකිරීම අනවසර බවයි. අනතුරුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසුවේ බළන්ගොඩ නගරයටම මෙවැනි ව්‍යාපාරයකට පවතින්නේ මෙය පමණක් බැවින් එය කරගෙන යාමට අවස්ථාව ලබාදීම පිණිස අනවසර තත්ත්වය පිළිබඳව එම ආයතනය දැනුවත් කිරීමක් සිදුකිරීමටත්, ඒ පිළිබඳ සභාවට තීරණයක් ගැනීමට හැකියාවක් ඇද්ද යන්න පිළිබඳව විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුවේ ඒ සඳහා ඉහත යෝජනාව ඉදිරිපත් කර ඇති බවත් සාකච්ඡා කර තීරණයක් ලබා ගත යුතු බවත්ය.

මේ සම්බන්ධව කාලයක් තිස්සේ සාකච්ඡා කළ බවත්, පොලිස් මූලස්ථානයටද මේ පිළිබඳව පැමිණිලි ලැබී ගොස් පොලිස් පරීක්ෂණයක්ද සිදුකළ බවත් ගරු ආණ්ඩුකාරතුමිය වෙතද පැමිණිල්ලක් ඉදිරිපත් වී තිබූ බවත්, ඒ සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා යවා පරීක්ෂා වාර්තාවක්ද ලබා දුන් බවත්, ගොඩනැගිල්ල අනවසර බව ඇත්ත බවත් මෘත දේහ ප්‍රදර්ශනය පිළිබඳ තත්ත්වය නොදන්නා බවත්, පසුගිය දිනක ඒ පිළිබඳ ගැටලුව මතු වූ විට

ඔවුන් දැනට මෘත දේහ ප්‍රදර්ශනය නොකරන බවට පැවසූ බවත්, ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා විසින් කරුණු පැහැදිලි කරමින් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පැවසුයේ, බළන්ගොඩ මෙවැනි ස්ථාන දෙකක් පමණක් පවතින බවත්, එයින් එක් ස්ථානයක් මෙය බවත් අද කාලයේ මරණයක් සිදු වූ විට ගෙවල්වලට ගෙනයා නොහැකි විශාල පිරිසක් සිටින බැවින් එවැනි අවස්ථාවලදී මෙම ස්ථානය එවැනි අයට හව්හරණයක් වන බවත්, ඒ අනුව මෙය නැති කරනවාට වඩා මෙය නීත්‍යානුකූලව කරගෙන යාමට අවස්ථාව සලසා දීම සුදුසු බවත්ය.

ගරු උප සභාපති නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ මීට කලින් මෙම ගැටලුව පිළිබඳව සාකච්ඡා කළ බවත්, මෙහි ගැටළුව වී ඇත්තේ පාලර් එකේ නොවන බවත්, ඉදිකිරීම අනවසර වීම ගැටලුව බවත්, එහිදී එය සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කර ප්‍රතික්ෂේප වී ඇති බවත්, එයට සංශෝධනය යොමු කරන ලෙස දැන් වුවද එය තවමත් ඉදිරිපත් කර නොමැති බවත්, මෙහි ගැටලුව වී ඇත්තේ පැමිණිලිකාර පාර්ශවය විසින් පළමුව චෝදනා කළේ පාලර් එකට බවත්, එහිදී ඔවුන් ගෙන්වා සාකච්ඡා කළ නමුත් දැන් ඉදිකිරීම අනවසර බවට චෝදනා කරන බවත්, ඒ අනුව ඔම්බුඩ්ස්මන් වරයාද විමසන්නේ ඉදිකිරීම අනවසර වීම පිළිබඳව බවත්ය.

ගරු නාගරික මන්ත්‍රයේ එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ අනවසර ඉදිකිරීමක් වන බවට පැමිණිල්ලක් පැමිණියේ නැද්ද යන්නයි. ගරු උපසභාපති නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ පැමිණිල්ල ලැබුණාද යන්න පිළිබඳව නොදන්නා බවත්, මෙම කාරණාව වැනි ගැටලු මතු වූ විට ගොඩනැගිලි අනවසර වන ගැටලුව මතුවන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුවේ අසල්වැසියෙකු පැමිණිලි කරන බවත්, මල් ශාලාව රාත්‍රියේ 10ට වසා තබන බවත් ආපසු උදේ විවෘත කරන බවත්, පසුගිය සභාවකදී මෙවැනි පාලර් එකක් නගර සභාවෙන් ක්‍රියාත්මක කිරීමටද යෝජනා වූ බවත්ය. මේ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසුවේ මෙම පුද්ගලයන් පැමිණිලි කරනු ලබන්නේ එම මල්ශාලාව අසලින් ගමන් කිරීමට කරදරයි ලෙස පවසමින් බවත්, එසේ බැලූ විට නිවෙස් වලද මිනී තබා ගැනීමට බැරි බවත්, එය අසාධාරණ බවත්ය .එහිදී ගරු සභාපතිතුමන් පැවසුයේ මෙහි ඇත්තේ පුද්ගලික ආරවුලක් බවයි.

ගරු නාගරික මන්ත්‍රී එම් නිමල් කරුණාරත්න මැතිතුමා පැවසුයේ මෙම දෙපාර්ශවයම හොඳින් සිටි බවත්, එහි ඇති වූ පෞද්ගලික ආරවුලක් හේතුවෙන් පළිගැනීම සඳහා මෙවැනි චෝදනාවක් සිදුකරන බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසුයේ අවුරුද්දක් තිස්සේ සුසාන භූමියේ අඩුපාඩු කියමින් නඩත්තු කටයුතු කළ බව පැවසුවද එයද මෙතෙක් සිදුවී නොමැති බවත්, එබැවින් මෙවැනි තැන් පිළිබඳව සොයා බලා එය කරගෙන යාමට

අවස්ථාවක් ලබා දෙන ලෙසත්, පුද්ගලික තරහවල් හේතුවෙන් මෙසේ සිදුකරන බවත් කවුරුත් යන්න ඉන්න තැන නිසා සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්ය.

ගරු සභාපතිතුමා විසින් මෙම ඉල්ලීම කරනුයේ ගම්වාසීන් ලෙස සඳහන් කරමින් අත්සන් ලේඛනයක්ද සහිතව බව පැවසූ අතර, ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ප්‍රේමදාස මැතිතුමා පැවසුයේ මෙහි ගම්වාසීන් ලෙස අත්සන් ලේඛන ඉදිරිපත් කර තිබුණද ඒවා හොර අත්සන් ලේඛන බවත්, තමන් සිටින කාලයේදීද මෙම ගැටලුව රැගෙන මෙම පාර්ශවයන් උදේ හවස සභාවට පැමිණිය බවත්, ගම්වාසීන් ලෙස අත්සන් යෙදුවද මෙයට වුවමනාවක් ඇත්තේ එක් පුද්ගලයකුට බවත් මොවුන් පුද්ගලිකව දන්නා බවත්ය.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය පැවසුයේ, මේ සඳහා සභාවෙන් අතුරු ව්‍යවස්ථාවක් හෝ පනවා කුමක් හෝ කළ නොහැකිද යන්න පිළිබඳව විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුවේ මේ පිළිබඳව සොයා බැලූ බවත් එවැනි දෙයක් සම්බන්ධයෙන් කොහේවත් අතුරුව්‍යවස්ථාවක් සම්පාදනය වී නොමැති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසුයේ සභාපතිතුමා මෙන්ම ගරු නාගරික මන්ත්‍රී එම් නිමල් කරුණාරත්න මැතිතුමාද නියෝජනය කරනු ලබන කොට්ඨාසය බැවින් මෙය මරණයක් සිදුවූ විට අත්‍යවශ්‍ය ස්ථානයක් බවත් ගම්වාසීන් සමඟ සාකච්ඡා කර මේ සඳහා විසඳුමක් ලබා ගන්නා ලෙසත්,ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා පැවසුයේ පසුගිය දිනෙක මරණයක් සිදුවී එය තැබීමට තැනක් නොමැතිව සිටියදී ඒ සඳහාද පෙට්ටියක් නොමිලේ ලබාදීමට කටයුතු සිදු කළේද මෙම අවමංගල්‍ය ශාලාව හිමිකරු බවත් ඔවුන් එවැනි දේ පවා සිදුකරනන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසුයේ මෙහි ගොඩනැගිල්ල සඳහා අනුමැතියක් නොමැතිකම ගැටලුව බවට පත්වී ඇති බවත්, පවත්නා අඩුපාඩු නිවැරදි කිරීමට උපදෙස් ලබාදී ඒ අනුව දඩ මුදලක් අයකර හෝ එය අනුමත කර අවශ්‍ය කටයුතු සිදුකිරීම සුදුසු බවත්, මෙය තමන් දන්නා ලෙසට පාලර් එකක් ලෙස ව්‍යාපාර ලියාපදිංචිය ලබාගෙන ඇති බවත්ය.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ ඔවුන් සාකච්ඡාවට පැමිණ ඉදිරිපත් කළ ලියාපදිංචි සහතිකයේ එසේ නොතිබූ බවයි.මෙහිදී ගරු සභාපතිතුමා පැවසුවේ මෙහි ලියාපදිංචිය පාලර් එකක් ලෙස මල්ශාලාවක් පවත්වාගෙන යාමට පමණක් බවට සඳහන් කර තිබූ බවයි.ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය සඳහන් කළේ අනුර ජයතුංග ෆ්ලෝරා ඇන්ඩ් පාලර් ලෙස මෙහි ලියාපදිංචි කර ඇති බවයි.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ ඔවුන්ගේ ගොඩනැගිලි සැලසුම ප්‍රතික්ෂේප වීමට හේතු දන්වා යැව්වද ඔවුන් එය නිවැරදි කර තවම ඉදිරිපත් කර නොමැති බවයි

ඒ අනුව පාලර් එක සම්බන්ධයෙන් දෙපාර්ශවයම ගෙන්වා කරුණු සාකච්ඡා කිරීමටත්, එම ගොඩනැගිලි සැලසුමේ අඩුපාඩු සංශෝධනය කර ඉදිරිපත් කරන ලෙස අවමංගලාශාලා හිමිකරු වෙත දන්වා යැවීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා පවසන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් බුලත්ගම සුසානභූමියේ තත්වය කෙසේද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ මෙහි අත්‍යවශ්‍ය නඩත්තු සිදු කිරීම සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දෙන ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාද දැනුවත් කළ බවත්, ඒ අනුව ඉදිරියේදී එහි යථාවත් කිරීම් සිදු කිරීමට බලාපොරොත්තු වන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ සුසානභූමියක මෘතදේහයක් මිහිදන් කිරීමට නගර සභාවෙන් අවසරයක් ලබා ගත යුතු බවත්, ඊයේ මෘතදේහයක් අනවසරයෙන් වළදමා ඇති බවයි.ගරු සභාපතිතුමා පැවසුයේ සති අන්ත දින වන විට එසේ අවසරය ලබා ගැනීම සතියේ දිනක සිදු කරන තෙක් දැනුම්දී කාර්යය සිදු කරන බවයි.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ එසේ අනවසරයෙන් මෘතදේහයන් වළදැමීම සම්බන්ධ වගකීම අදාළ නිලධාරීන් භාරගත යුතු බවත්, බුලත්ගම සුසානභූමියේ ගස් ටික ඉවත් කරලා එම කටයුතු කිරීමට හිටපු සභාපතිතුමාද පුනා පුනා කතා කළ බවත්, පසුගිය දිනක මළගෙදරකට සහභාගී වූ විට බුලත්ගම සුසානභූමියේ පවතින තත්වයට සිටි පිරිස දොස් කියූ බවත්, පාංශුකූලය දෙන්නතිබුන සොහොන්ගෙය අදවන විට ජරාජීර්ණ වී ඇති බවත්, සුද්ද කර නොමැති බවත්, එහි තත්වය ඉතාම ශෝචනීය බවත්, වහාම ඒ පිළිබඳ සොයාබලන ලෙසත්ය.

**07:01:11** නගර සභා ක්‍රීඩා පිටිය හා පොල අතර වල් බිහි වී ඇති ඉඩම ඩෙංගු රෝග ව්‍යාප්ති පාලනය සඳහා පවිත්‍ර කිරීමට ප්‍රාදේශීය ලේකම් දිසා අධිකරණයෙන් ඉල්ලීම් කර ඇත. එම ඉල්ලීම අනුව විධිමත්ව සෙසු පාර්ශවයන්ට පිටපත් සහිතව විවෘත අධිකරණයෙන් කරුණු තහවුරු කර අයදින ලෙස දිසා අධිකරණ විනිසුරුතුමිය නියෝග කර ඇති බව ප්‍රාදේශීය ලේකම් දන්වා ඇත.

මීට පෙරද මෙම ඉඩම් කොටස පිරිසිදු කිරීමට අධිකරණයෙන් ඉල්ලීම් කල අවස්ථාවේදී නඩුවට අදාළ දෙපාර්ශවය විසින් එය පිරිසිදු කරන ලෙස දන්වන ලදී. මෙම ඉඩම නගර සභාව සතු වන බැවින්ද, මෙම ඉඩමේ අයිතිය සඳහා වන නඩුවේ අප ආයතනය පාර්ශවයක් වන බැවින් ඉදිරි කටයුතු පිළිබඳව තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා පැවසුවේ සම්බන්ධීකරණ කමිටුවේදී කළ යෝජනාවක් අනුව,මේ සඳහා අධිකරණ කටයුත්තක් ක්‍රියාත්මක වන බැවින් මැදිහත් වන ලෙස ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් ඉල්ලීමක් අධිකරණ විනිසුරුතුමිය වෙත දන්වා ඇති බවත්, ඒ අනුව අධිකරණයෙන් පැමිණි නියෝගය මෙලෙස ප්‍රාදේශීය ලේකම්තුමිය සභාව වෙත දන්වා ඇති බවත්, ඒ අනුව මෙම ඉඩමේ පිරිසිදු කිරීමේ අවශ්‍යතාවය පවතින බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා අදහස් දක්වමින් පැවසුවේ මෙම ඉඩම සුද්ද කිරීමට ගොස් පසුගිය කාලයක ගැටලුවක්ද ඇති වූ බවයි. ඒ අනුව සභාවේ මේ පිළිබඳ නිශ්චිතය තීරණයක් නොවීය.

**07:01:12** 2026 අප්‍රේල් මස දෛනික වැටුප් වෙනුවෙන් රු.1,557,755.05ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ පසුගිය සභාවාරයේද මෙම යෝජනාවට විරුද්ධ වූ බවත්, පසුගිය සභාවාරයේ මේ ගැන කතා කරනකොට 'හෙට ඉඳන් ක්‍රියාත්මක වෙනවා' කියලා සභාපතිතුමාට ඇවිල්ලා උපදෙස් දුන් බවත්, ඒ අනුව පසුගිය මාසයේ ලියුම් 57ක් ගහලා තියෙන බවත්, නමුත් එක්අයෙකුට පමණක් වැඩේ ක්‍රියාත්මක වී ඇති බවත්,එම ලියුම් 57 ගහපු විදිහ, තෝරපු විදිහ, ලියුම් 57 ගහන්න මෙම පත්වීම්වලට දැම්මේ කවුද කියන එක, මේක තීරණය කළේ කව්ද කියන තොරතුරු සියල්ල නගර සභාව ඇතුළේ ඉන්න කට්ටියම තමන්ට කතා කරලා පැවසූ බවත්ය.

මේ රටේ උත්තරීතර ලියවිල්ල වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බවත්, මන්ත්‍රීවරුන් විදිහට අපිත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කරනවා කියලා ප්‍රතිඥා දීලා තියෙන බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 147 මඟින් මූල්‍ය පාලන බලතල තියෙන්නේ පාර්ලිමේන්තුවට බව පැහැදිලිව ප්‍රකාශ කර ඇති බවත්, ඒ අනුව පාර්ලිමේන්තුව නීති, අණපනත් සම්මත කරල ක්‍රියාත්මක කිරීමට එවන බවත්,

එමෙන්ම නගර සභා ආඥා පනතේ 153 හි වියදම් කිරීමේ වගකීම පවතින්නේ සභාවට බව පැහැදිලිවම කියන බවත්, ඒ අනුව වියදම් කිරීමේ සම්පූර්ණ වගකීම සභාව ගත යුතු බවත්, මෙහිදි සභාව කියන්නේ අපි 16 දෙනාම බවත්, එවිට නිලධාරීන් මෙයට අදාළ වෙන්නේ නැති බවත්, අපි අවුරුද්දකට දළ වශයෙන් දෛනික වැටුප්වලට මිලියන 20ක්, 25ක් අතර ප්‍රමාණයක් ගෙවන බවත්, එහෙම වියදම් කරලා ඒකේ අධිභාරයක් වුණොත්, අපි 16 දෙනාම

මේකට වගවුණොත් අපි මාසෙකට රු.1,562,500ක් එක්කෙනෙක් ගෙවිය යුතු බවත්, 14 දෙනෙක් මේක ගෙවන්න සිදු වුවහොත් රු.1,485,000ක් ගෙවිය යුතු බවත්, අට දෙනෙකුට ගෙවන්න වුණොත් රු.3,125,000ක් ගෙවීමට සිදු වන බවත්,

ඒ අනුව දැනටමත් තමන් මේ කියන කරුණ විගණනයට ලක්වෙලා තියෙනවාද? යන්නත්, අධිභාරයක් සිදුවුවහොත් මේක ගෙවන්න වෙන්නේ අනුමැතිය දීපු කට්ටියටද? විරුද්ධ වුණ අය ගෙවීමකට බැඳී සිටිනවාද? යන්නත්,ඒ වගේම මෙහි නිලධාරීන් මේ සම්බන්ධයෙන් ගෙවීමට යටත් වෙනවාද යන්නත් තමන් විමසන බව එතුමා පැවසීය.

තවද සභාව නැති අවදියේ එක්තරා ප්‍රසම්පාදන නිලධාරිනියක් සම්බන්ධව අදත් අල්ලස් එකේ ප්‍රශ්නය යන බවත්, අපි වුණත් කවුරුහරි පුද්ගලයෙකුට යම්කිසි රැකියාවක් දෙන්න පුළුවන් නම්, ඒක හෘද සාක්ෂියට එකඟවම දෙන බවත්, ඒක දෙන්නේ අරක්කු බෝතලයකටවත්, සල්ලි කීයකටවත් උපකාර කරගෙන නොවන බවත්, එසේම පසුගිය කාලසීමාවේ තමනුත් රජයේ රැකියා දෙන්න සම්බන්ධ වෙලා තිබෙන බවත්, ඒක සද්භාවයෙන් කළ බවත්, එසේ රජයේ රැකියා දෙන්න පුළුවන් ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු සඳහා පමණක් බවත් එතුමා වැඩිදුරටත් කරුණු දක්වමින් පැවසීය.

එසේම නදීෂාන් උප සභාපතිතුමා, වසන්ත මන්ත්‍රීතුමා, නිමල් මන්ත්‍රීතුමා එසේ රැකියා දෙන්න සම්බන්ධ වෙලා ඇති බවත්, අදටත් ඉතාමත් අහිංසක මනුස්සයෙක් අපේ නදීෂාන් මන්ත්‍රීතුමා දීපු රැකියාවකින්, ඒ මනුස්සයාගේ ස්වාමියෙකුත් නැතුව දරුවොත් හදාගෙන අද ලස්සනට ජීවත් වෙන්නේ ඒ දීපු රැකියාවෙන් බවත්, තමන්ට වැඩ කරපු කෙනෙකුට හරි, උදව් කරපු මනුස්සයෙකුට හරි ඒ රැකියා අවස්ථාවක් දෙන්න පුළුවන් නම් කවුරු වුණත් කැමතියි බවත්, එක අවස්ථාවකදී උත්සාහ කළා අපේ හිටපු සභාපතිවරයෙක් එවැනි පවුලකට රැකියාවක් දෙන්න, නමුත් ඔහුට එය කරගන්න බැරි වුණ බවත්,එවැනි දේ වලදී අපි සද්භාවයෙන් සතුටු වෙන බවත්,

නමුත් මෙතන ප්‍රශ්නේ තියෙන්නේ, මේකේ අපි රජයේ මුදල් මේ සඳහා දෙපාරක් වැය කිරීම බවත්, යම්කිසි පුද්ගලයෙක් ඒ තනතුරකට පත් කරලා තියෙනවා නම්, එතකොට දේශපාලන අධිකාරිය ඇත්තටම තනතුරක් දීලා තියෙනවා නම්, ඒ තනතුර දීලා තියෙන්නේ තමන්ට දෙන්න පුළුවන් තනතුර බවත්, එතනින් එහා තනතුරුවලට විවෘත තරග විභාග තියෙනවා, නැත්නම් ඒ අධ්‍යාපන සුදුසුකම් වෙන වෙන විදිහට ඉල්ලන බවත්, සද්භාවයෙන් මේ දීපු රැකියාවලුත් දුන්නට පස්සේ, 'අනේ මට ඒක කරන්න බැහැ, හරි? මට ඒ තැන වැඩ කරන්න බැහැ' එහෙම කියලා එකක් මේ මේ රාජ්‍ය යන්ත්‍රය තුළ නැති බවත්, ධුරාවලියක් හදලා තියෙන්නේ ඒ ඒ විදිහට බවත්, එතනට ගොස් තමන්ට තියෙන රැකියාව නැතුව වෙන රැකියාවක් ඉල්ලන්න එහෙම අවස්ථාවක් නැති බවත්, ඒකට ක්‍රමවේද මේ රාජ්‍ය යන්ත්‍රයෙන් හදලා තියෙන බවත්,

මේකේ එක්කෙනාට හිතවත්කම්වලට වැඩ කරන්න ගියාට පස්සේ තමයි මේ වැඩේ සම්පූර්ණයෙන්ම මෙහෙම වෙලා තියෙන්නේ යන්නත්, එබැවින් ඕනෑම කෙනෙක් මෙය සම්මත කරගන්නා ලෙසත්, තමන්ට මේ අවස්ථාවේ මේ කරුණු දෙකට, බෙදීමක් ඉල්ලා සිටින බවත්, ලියුම් 57 ගහපු එකත් අපරාධයක් බවත්,කොළ 57 තියාගෙන සිටියනම් ඊට වඩා වටින බවත්, සභාපතිතුමත් ප්‍රකාශ කළා බොහොම පැහැදිලිවම 'හෙට ඉඳන් ක්‍රියාත්මක කරනවා' කියලා, මාසෙක දවස් ගණනක් ගිහින් තියෙනවා තාමත් ඒ විදිහමයි යන්නත්, තමන්ට මෙම පුද්ගලයෝ කවුරු වුණත් වැඩක් නැති බවත්,මෙම මුදල් නාස්තිය වෙනුවෙන් තමයි තමන් මෙච්චර දවසක් කතා කළ බවත්, තමන්ට ගෙවන්න සල්ලි නැති බවත්, ගෙවන්න පුළුවන් ඕනෑම කෙනෙකුට සම්මත කර ගත හැකි බවත්, තමන් මෙහි අහපු කරුණු තුන වන ,

- දැනටමත් මේක විගණනයට ලක්වෙලා තියෙනවාද? මේක අධිභාරයක් වෙන බව විගණනයට ලක්වෙලා තියෙනවාද?
- අධිභාරයක් වුණොත් ගෙවන්න වෙන්නේ අනුමැතිය දුන්න අයටද?
- විරුද්ධ වුණ අයට ගෙවීමක් සිද්ධ වෙනවාද?

යන කරුණු සඳහා කාරක සභා අවස්ථාවක් කර ලේකම්තුමිය පිළිතුරු ලබා දෙන ලෙස පවසන බවත්, ඊට අමතරව මේ සඳහා බෙදීමක් ලබා දෙන ලෙස යෝජනා කරන බවත්, 'අනේ අරයා පව්, මෙයා පව්' කිව්වට ඔය කවුරුත් ඊළඟට මෙතෙන්ට එන්නේ නැති බවත්, ඡන්දය දීලා මේකට බෙදීමක් ඉල්ලා, විරුද්ධ වෙච්ච අයගෙන් අධිභාරයක් සිද්ධ වෙන්නේ නැහැ කියන කාරණය තමන් හොඳාකාරවම දන්නා බවත්,මේ කරන නාස්තිය මේක හැමදාම බලාගෙන ඉන්න බැරි බවත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා දීර්ඝව අදහස් දක්වමින් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ඉහත බෙදීම ලබා ගැනීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා පැවසූයේ රාජකාරී යෙදවීම්වල වෙනස්වීම් සිදු කළ බවත්, නමුත් සමහර වෙනස්කිරීම් තවදුරටත් සලකා බැලීමට අවශ්‍ය බවත්, අවභාවිතයක් වෙලා තියෙනවා කියලා ඉහත මන්ත්‍රීතුමා පවසන බවත්, එය වළක්වන්න තාමත්.උපරිම උත්සාහ කරන බවත්, කෙසේ නමුත් මෙහි පවතින කාඩර් එක පරණ කාඩර් එකක් බවත්, නමුත් වර්තමානය වන විට සේවාවන් වැඩිවෙලා, අවශ්‍ය පහසුකම් සපයන්න තියෙන අවස්ථාවන් වැඩිවෙලා තිබෙන බවත්, එබැවින් කොහොමත් පිටින් සේවාවන් මිලදී ගැනීමට සිදු වන බවත්, එසේ මිලදී නොගෙන මේ කාර්යයන් සාර්ථකව සිදු කිරීමට නොහැකි බවත්, එබැවින් සම්පූර්ණයෙන් මෙම දෛනික වැටුප් ගන්න කණ්ඩායමක් නැතුව මේක යන්න බැරි බවත්, ඒ අනුව මෙම මුදල නොගෙවා ඉන්නවා කියන එක සාර්ථකව සම්පූර්ණ කරගන්න හැකියාවකුත් නැති බවත්ය.

ඊට පිළිතුරු ලබා දෙමින් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ එළියෙන් ශ්‍රමය මිලදී ගන්න එක ගැන තමාගේ කිසිදු විරුද්ධත්වයක් නැති බවත්, එමෙන්ම මෙහි න්‍යාය පත්‍රයේ දාලා තියෙනවා රියදුරන් ගන්න ඕනේ කියලා, ඒ අනුව එයට පූර්ණ සහයෝගය දෙන බවත්, රියදුරන් තුන්දෙනෙක් නෙමෙයි, මෙහි රියදුරන් 04 දෙනෙකු සඳහා පුරප්පාඩු පවතින බවත්, තමන් මේ කියන දේ මොකක්ද කියන එක සම්බන්ධයෙන් සභාපතිතුමාට තේරුම්ගත හැකි බවත්,ඒ අනුව තමන් කලිනුත් පැහැදිලි කර දුන් පරිදි මෙහි සෞඛ්‍ය කම්කරුවෝ 18ක් ඉන්නකොට, මාර්ග නඩත්තු කම්කරුවෝ ප්‍රමාණයක් ඉන්නකොට, මෙහි ගැටළුව වී ඇත්තේ එම පිරිසට ඒ අදාළ රැකියාවේ නිරත වෙන්න බැහැ කියන එක බවත්, එසේ නිරත වෙන්න බැහැ කියලා කියනකොට අපි ඒගොල්ලන්ව මෙහි ඇතුළේ තියාගෙන, අපි එළියෙන් දෛනික වැටුප්වලට  ඔවුන්ගේ සේවාව වෙනුවෙන් නැවතත් මුදල් වැය කරන බවත්ය.

එමෙන්ම එයට රජයෙනුත් මුදල් රැගෙන සභාවෙනුත් නැවත මුදල් අය ගෙවීමක් සිදුවන එවිට එයට බලය දෙන්නේ සභාව බවත්, මෙය සම්මත කරගැනීම පිළිබඳ කිසිදු ප්‍රශ්නයක් නැති බවත්,එමෙන්ම  රියදුරු බඳවා ගැනීමට හෝ මෙහි තිබෙන පුරප්පාඩුවලට පිටින් ශ්‍රමය ලබා ගැනීම් සම්බන්ධයෙන් තමාගේ කිසිදු විරුද්ධත්වයක් නැති බවත්, මෙය කරගෙන යාමට එය අවශ්‍ය බව දන්නා බවත් පැවසූ එතුමා,

නමුත් මෙහි ගැටළුව වී ඇත්තේ සභාපතුමා කිව්ව පැහැදිලි කිරීම් අනුව මෙය කළමනාකරණය කරගන්න සේවකයෝ මදි නම්, ඒ පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කළ යුතු බවත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඒ අනුව එය තීරණය කරන බවත්, එය සිදුකිරීම වෙනම ක්‍රියාදාමයක් බවත්,  නමුත් මෙහි සිදු වන්නේ, අපේ කාඩරය මේක ඇතුළේ තියාගෙන, අපි ඔවුන්ගෙන් වැඩ ගන්නේ නැතුව බාහිර පුද්ගලයන්ගෙන් නැවත සේවය මිලදී ගැනීම බවත්, එක කර්තව්‍යයකට රජයේ මුදල් දෙවරක් වැය වන බවත්, ඒ වැයවීම කවදාහරි දවසක නැවත මේ සභාවට අය කරගන්න වෙන බවත්, එය  අදද, හෙටද, අනිද්දාද, ලබන අවුරුද්දේද, තව අවුරුදු පහකින්ද කියලා කියන්න බැරි බවත්, එබැවින් තමාට බෙදීම ලබා දෙන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා කරුණු පැහැදිලි කරමින් වැඩිදුරටත් පවසන ලදී.

මෙම අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසුයේ කාරක සභා අවස්ථාවක් කර ඉහත දැක්වූ කරුණු පැහැදිලි කරන ලෙසයි. ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමියද සඳහන් කලේ මෙහි  මුදල් ගෙවීමක් කරන්න සිදු වුණොත් ඒ පිළිබඳව කරුණු ආදිය පැහැදිලි කර ගැනීමට අවශ්‍ය බවත්,  ඒ අනුව මෙහි ඡන්දයෙන් වැළකී සිටීමේ නීතිමය තත්වය පිළිබඳව ලේකම්තුමියගෙන් කරුණු පැහැදිලි කර ගැනීමට අවශ්‍ය බවත්ය.

ඒ අනුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

එහිදී බෙදීමකට ගොස් විරුද්ධත්වය ප්‍රකාශ කළ සභිකවරයාට මෙහි අධිහාරයක් සිදු නොවන බවටත්, එහිදී ඡන්දයෙන් වැළකී සිටින සභිකවරුන් වෙත ඒ වනවිට විගණනයෙන් තීන්දු කරන තීරණයක් සිදු වන බවටත්, වියදම් දැරීමේ සම්පූර්ණයෙන්ම බලතල තියෙන්නේ ගරු සභාවට වන බවටත් ලේකම්තුමිය කරුණු පැහැදිලි කරමින් පැවසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ සමහර අවස්ථාවල අත්‍යවශ්‍ය රාජකාරී යෙදවීම් ලෙස එලෙස තනතුරෙන් බැහැරව වෙනත් රාජකාරීවල යෙදවීම් සිදු කිරීමට සිදු වන අවස්ථා පවතින බවත්, එසේ සිදු නොකර මෙය පවත්වා ගෙන යා නොහැකි බවත් උදාහරණයක් ලෙස ආදායම් අංශයේ ආදායම් එකතු කිරීමේ කාර්යය වෙනුවෙන් පවතින වපසරියත් සමඟ එලෙස යෙදවීමට සිදු වී ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින් කාලයක් තිස්සේ දිගින් දිගටම මෙය කතා කරන බවත්, දිගින් දිගටම ඇදී යන බවත්, වියයුතු දේවල් අසන බවත්, එසේම සභා වාර්තාවලට ඇතුළත් විය යුත්තේ මොනවාද බලලා ඒ ප්‍රශ්න ටික ලේකම්තුමියගෙන් අසන බවත්, හර්ෂණ මන්ත්‍රීතුමා කියන්නේ මෙම තනතුරුවල පිහිටවන ලෙස බවත්, නමුත් එතන අස්සේ තියෙන ප්‍රශ්න ටික පිළිබඳව ආණ්ඩුකාරතුමිය ඉඳලා කොමසාරිස්තුමා දක්වා සියලු දේවල් පිළිබඳවම දැනුවත් බවත්, මේවා අලුතින් කරන දේවල් නොවන බවත්, එසේම කවුරුත් නොදැන කරන දේවල්ද නොවන බවත්, නමුත් තියෙන ප්‍රශ්නය අනුව අපිට උත්තරයක් දී ගන්න බැරි බවත්, මෙය දිගින් දිගටම ප්‍රශ්නයක් බවත්, එසේම මෙය සෑම සභා වාරයකදීම ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙන බවත්, හිටපු සභාපතිතුමා කියනවා පළාත් පාලන ආයතන වල සේවකයන් 9500 කටම මේ ප්‍රශ්නය එහෙම්මම තිබෙන බවත්, මේක අද ඊයේ ආපු දෙයක් නොවන බවත්, ඒ අනුව මෙම ප්‍රශ්නෙට විසඳුම් කරනු ඇති බවත්, මොකද මෙය අපි විතරක් කරන වැරැද්දක් නොවන බැවින් එවිට එම අවස්ථාවේදී අපටද මෙම ප්‍රශ්නය විසඳා ගත හැකි බවත්ය.

වැඩිදුරටත් අදහස් දැක්වූ එතුමා පැවසුයේ බෙදීමකට යාම ගැටළුවක් නොවන බවත්, මෙය අපි කරන්නේ හදවතින් බවත්, මේකට ඇවිල්ලා පිටින් කම්කරු ටික ගෙනල්ලා වැඩ කරවලා ඒ මිනිස්සුන්ට අනවශ්‍ය විදිහට රාජ්‍ය මුදල් දීමක් සිදු නොකරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා ,සෞඛ්‍ය කම්කරු කීප දෙනෙක් රියදුරන් ලෙස යොදවලා තියෙන බවත්, ඒක ගැන කතා කරන්න ගියවිට එම රියදුරන්ගේ තනතුර නාමය වෙනස් කරලා, සහායක රියදුරන් ලෙස යොදවීමට බලයක් දෙන්නම් කියලා කිවූ බැවින් එය

සම්බන්ධව ගත් ක්‍රියාමාර්ගය කුමක්ද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ මෑතක ගිය වෙලාවෙත් ඒ සම්බන්ධව කරුණු විමසු බවත්, පරිපාලනයට එම හැකියාව පවතින බව පැවසූ බවත්, තනතුර නාමය වෙනස් කිරීමට නොව තනතුරේ ඉඳලා රියදුරෙකු ලෙස යොදවන්න පුළුවන් හැකියාව ලේකම්තුමියට ඇති බවත්ය.

නැවතත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා පැවසුයේ උදාහරණයක් ලෙස කෝසල ගිනි නිවන ඒකකයේ වැඩ කරන බවත්, නමුත් සෞඛ්‍ය කම්කරු බවත්, නමුත් මෙහි ගිනි නිවන ඒකකයක් නොමැති බවත්, 2025 සැප්තැම්බර් සිදුකළ ජාතික විගණන කාර්යාලයේ වාර්තාවක රියදුරු පුරප්පාඩු පහක් ලෙස සඳහන් වන බවත්, මෙලෙස එම සේවාවවන් වෙනුවෙන් ආදේශ කරන අයට මොකක් හරි රැකවරණයක් තිබිය යුතු බවත්, ඒ අනුව මෙම පිරිස පරීක්ෂණයකට යොමුකළ බවත්, ඔවුන් එය සමත් වී ඇති බවත්, රියදුරන් හැටියට ඒගොල්ලන්ට වැඩ කරන්න පුළුවන් කියන එක එම රියදුරු පරීක්ෂකවරු සමත් කරලා තියෙන බවත්, ඒ අනුව තමන් පවසා සිටින්නේ රියදුරන් නොමැති වෙලාවට මොවුන් සහායක රියදුරන් ලෙස යොදවාගැනීමට සභා තීන්දුවක් ගැනීම සුදුසු බවත් එතුමා පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ මුලින් එතුමා යවපු ඉල්ලීමට පැමිණිය පිළිතුර වන්නේ පරිපාලන නිලධාරීන්ට ඒ හැකියාව පවතින බවත්, මෙහෙන් රාජකාරී ලැයිස්තුවක් සපයා රියදුරක් ලෙස වැඩ කළ හැකි බවත්,ඉන් පසුවද තමන් මේ පිළිබඳව තනතුරු නාමයත් එක්කම වෙනස් කළ හැකිද යන්න පිළිබඳව විමසීමක් කළ බවත්, එයට තමව පිළිතුරු නොලැබුන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ එසේ තනතුරු නාමය වෙනස් කළ නොහැකි බවයි.ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ එසේ තනතුරු නාමය වෙනස් කරලා දෙන්නෙක් මෙහෙට පැමිණිය බවත්, සෞඛ්‍ය කම්කරු කියන එකේ පළවෙනි ඡේදය වෙනස් කරලා කාර්යාල කාර්ය සහායක කියලා පැමිණිය බවත්,ඒ අනුව තමන් කියන්නේද මෙහි සිටින අයට ඒක කරගන්න පුළුවන්නම් එයට අවස්ථාවක් දිය යුතු බවත්ය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසුයේ සෞඛ්‍ය කම්කරු බාණ්ඩයේ සිටින අයෙකු රියදුරෙක් කියලා අනියුක්ත කරගත් විට සිදු වනුයේ අපිට සෞඛ්‍ය කම්කරුවෙක් නැවත මෙතනට ගන්න බැරි වෙන එක බවත්, මොකද ඔහු ඉන්නේ වෙනත් කාණ්ඩයක තනතුරක බැවින් බවත්, ලංකාවේ මේ බලන්ගොඩ නගර සභාවේ පමණක් මෙහෙම ප්‍රශ්නයක් පවතින බවත්, සෞඛ්‍ය කම්කරුවෝ ටිකක් සිටිනවා හැබැයි ඔවුන්ගෙන් අදාළ රාජකාරිය ඉටු කර නොගන්නා බවත්, එලෙස සිදුකර ඒ සෞඛ්‍ය රාජකාරිය හෝ මාර්ග නඩත්තු රාජකාරියම කරගැනීමට නැවත මුදල් වැය කරලා එළියෙන් මිලදී ගන්න මුදල් වැය කරන බවත්ය.

එවිට සිදු කළ යුත්තේ NVQ සහතික තියෙනවා කියන අයට මෙන්ම රැකියා ලක්ෂයෙන් ආපු අයට පුළුවන් එක් අයෙකුට දෙදෙනෙකුට පළවෙනි ඡේදය වෙනස් කරලා කරලා දුන්නා නම්, අනිත් පුද්ගලයන්ටත් ඒ වැඩේ කරගන්න පුළුවන් වෙන්න ඕනි බවත්, එවිට මාර්ග කම්කරුවෙක් හරි, නැත්නම් සෞඛ්‍ය කම්කරුවෙක් හරි රියදුරෙක් හැටියට පත් කරලා ගියොත් ,එවිට මාර්ග කම්කරුවෙක් එළියෙන් මිලදී ගන්න පුළුවන් බවත්, එතකොට ප්‍රශ්නයක් නැති බවත්,නමුත් දැන් ආදේශක කියලා අපි යෙදවූ පසු සෞඛ්‍ය කම්කරුවා නැවත මිලදී ගන්න බැරි ප්‍රශ්නයක් එන බවත්, මෙහි කාඩරය හිස් වෙන්නේ නැති බවත් එතුමා පවසන ලදී.ගරු සභාපතිතුමාද පැවසුයේ ඉහත මන්ත්‍රීතුමා සඳහන් කරන පරිදි එවිට කාඩරය හිස් නොවන බවයි.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ තමන්ගේ කාලයේ මේ පිළිබඳව ආණ්ඩුකාරතුමිය සමඟ පුද්ගලිකවම ගොස් කතා කළ බවත්,එයට ගරු සභාපතිතුමාද සහභාගී වූ බවත්, ඒ අනුව එහිදී හැම තැනම මේ ආකාරය බව ආණ්ඩුකාරතුමිය පැවසූ බවයි.

ගරු සභාපතිතුමා පැවසුයේ කලින් මන්ත්‍රීතුමා සඳහන් කළ දෙදෙනා පුහුණු කාලේ ඉඳලා අලුතෙන්ම ස්ථිර වෙන නිසා තමයි, එම අයගේ සුදුසුකම් තිබෙන නිසා කාර්යාල කාර්ය සහායක තනතුර ලබා දී ඇති බවත්, නමුත් දැන් සේවයේ ඉන්න අයට එම ගැටළුව පවතින බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ රැකියා ලක්ෂයේ ඉන්න අයත් පුහුණු වෙලා තියෙනවා රියදුරු තනතුර සඳහා ඒ අවශ්‍ය දේවල් ටික තිබෙන බවත්, අපිට පුළුවන්නම් පළවෙනි ඡේදය වෙනස් කරලා ඔවුන්ට ඒ අවස්ථාව ලබා දෙන්න, එය ලබා දිය යුතු බවත්ය.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ එම පිරිස රැකියා ලක්ෂයේ පුහුණු වුන අන්තිම කණ්ඩායම බවත්,එම පිරිසගේ පත්වීම් ස්ථිර කලේ මේ මෑතකදී බවත්, ඒ අවස්ථාවේ ඒගොල්ලන්ගේ පත්වීම් ලිපිය ගැහුවාට පස්සේ එම අවස්ථාවේ වැඩ භාරගන්නේ නැතුව ගිහිල්ලා පත්වීම් ලිපිය වෙනස් කර ගත් බවත්, අනිත් පිරිසගේ පත්වීම් ලිපිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව හරහා ස්ථිර පත්වීම් ආපු නිසා ඒවා වෙනස් කළ නොහැකි බවත්ය.

ඉහත හර්ෂණ මන්ත්‍රීතුමා පැහැදිලි කරන්නේ, එකම කාරණයට දෙවරක් මුදල් ගෙවීම බවත්, ඒ අනුව එය අධිභාර වන බවත්, හිටපු සභාපතිතුමාගේ තර්කයයි එතුමාගේ තර්කයයි ගොඩක් වෙනස් බවත්, ඒක වෙනම මාතෘකාවක් බවත්,මේ මාතෘකාව තියෙන්නේ,තමන් මෙලෙස අදහස් ප්‍රකාශ කරන්නේ මේ සඳහා විරුද්ධ වීමට නොවන බවත්, දැන් මම කම්කරු පත්වීමට ඇවිල්ලා තියෙන්නේ නම් එතකොට මම කම්කරු වැඩ කොටස කරන්නේ නැතුව, තව කම්කරුවෙක්ව ලබාගන්න කොට, එක්කෙනෙකුට ගෙවන්න ඕනේ මුදල තව පාරක් ගෙවන

බවත්,එතකොට අපි 10 දෙනෙකුට ගෙවන මුදල 20 දෙනෙකුට ගෙවා ඇති බවත්, නැති 10 දෙනෙකුට ගෙවීම වෙනුවෙන් අධිභාරයට යන බවත්, ඒ ගැටලුව මෙහි පවතින බවත්ය.

නැතිනම් මෙහි කෝසල, සාලින්ද වගේ අය සේවයේ යෙදවීම පිළිබඳව කිසිම ගැටලුවක් නැති බවත්, ඒ සඳහා අපේ සභාවෙන් අපිට තීන්දු තීරණ ගත හැකි බවත්, නමුත් මෙහි දෙවරක් ගෙවීම බරපතල ගැටලුවක් වන බවත්, තමන් ඒ පිළිබඳව සොයා බැලූ බවත්, මාලක මන්ත්‍රීතුමා මෙන්ම අනිත් මන්ත්‍රීවරුන් ඔක්කොම කිව්වා මින් පස්සේ අපි මේක නීත්‍යානුකූලව ආවේ නැත්නම් මෙයට සහයෝගය ලබා නොදෙන බව පැවසූ බවත්,ඉන්පසු තමන් කොළඹ සිටියදී දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ කොමසාරිස්තුමා සමඟද නිකන් සාකච්ඡා කර බැලූ බවත්, ඒ අනුව එහිදීද පැවසුයේ අපිට අවශ්‍ය ආකාරයට සේවයේ යෙදවිය හැකි බව බවත්, නමුත් මෙහි තියෙන්නේ එක්කෙනෙකුට ගෙවන්න ඕනේ මුදල අමතර අයෙකුට නීත්‍යානුකූල නොවන විදිහට තව ගෙවීමක් සභාව එළියට යවන බවත්, එය බරපතල චෝදනාවක් වශයෙන් මෙතන එන බවත්, ඒ අනුව එය නිරවුල් කරගත යුතු බවත්, ඇත්තටම තමනුත් කියන්නේ මේ ඉන්න දක්ෂ නිලධාරීන් බවත්, සාලින්ද සැලකූ විට අපිට ගන්න බැරි අපහසුතාවයන් තියෙන වරිපනම් ඔක්කොම එකතු කර දෙන බවත්, නමුත් එම අය කම්කරුවන්ට දැම්මොත් ඔවුන්ගෙන් දැන් ගන්න පුළුවන් සේවය අපිට ලබාගන්න බැරි බවත් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් පැවසීය.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ මෙහි හර්ෂණ මන්ත්‍රීතුමා ඉස්මතු කරපු කාරණාවේ වැරැද්දක් නැති බවත්, අපි ඔය කියන කණ්ඩායම අදාල වෘත්තියේ යෙදවුවොත් එතකොට රියදුරු පුරප්පාඩුව පුරවන්නේ කව්ද යන්නත්, ආදායම් එකතු කරන්නේ කව්ද යන්නත්, ඒ අනුව එතුමාගේ තර්කය නිවරදි වුවද, එතකොට මේ සභාව ඉදිරියට ගෙන යන්නේ කව්ද යන්නත් පවසන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා පැවසූයේ තමන්ද පවසන්නේ මේගොල්ලන් කරන්න කටයුතු තව කෙනෙකුට කරන්න බැරි බවත්, නමුත් මෙතන තියෙන්නේ අපි කරපු වැරැද්ද, අපේ කාලය තුළ වෙච්ච වැරදි සිදුවීම් නිසා තමයි මේ ලෙස දිගටම යන්නේ බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා නැවතත් අදහස් දක්වමින් ආදායම් අංශයේ මොනවා හරි ප්‍රශ්නයක් තියෙනවා නම් හරි, ඒකට කාඩර් එක මදි නම් හරි,සභාවට දාලා එයට අවශ්‍ය පිරිස ලබාගැනීමට අනුමැතිය ලබා ගත යුතු බවත්, මෙහි බල්ලගේ වැඬේ බූරුවට දීලා කරන වැඩ පිළිවෙළක් වෙලා තියන බවත්, ඒවාට සභාවෙන් අනුමැතිය ලබා දීමට කැමති බවත් පවසන ලදී.

පසුගිය මාසේ මේ ප්‍රශ්නය සිදු වූ පසු සභාපතිතුමා මේ සම්බන්ධව ආණ්ඩුකාරතුමාට හරි, කොමසාරිස්තුමාට හරි කතා කරේ නැද්ද යන්න ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසූයේ එසේ කතා කළ බවත්, එමෙන්ම

ආයතනය තුළද වෙනස් කිරීම් සිදු කිරීමට උත්සාහ කළ බවත්, නමුත් දැන් එහිදීද ප්‍රායෝගික ගැටලු මතුවී ඇති බවත්ය.

අනනතුරුව ගරු උප සභාපතිතුමා පැවසූයේ මෙය දිගින් දිගටම මෙම සභාවේ මන්ත්‍රීවරුත් එක්ක රණ්ඩු වෙන්නත් බැරි බවත්, මන්ත්‍රීවරුන්ට බනින්නත් බැරි බවත්, නමුත් සභාපතිතුමාත් සමඟ රාජකාරි ලැයිස්තුවක් හැදූ බවත්, සභාපතිතුමා ඒක ක්‍රියාත්මක කළ යුතු බවත්, කාගේ හරි බලපෑමක් මත ඒක ක්‍රියාත්මක කරන්නේ නැතුව එතන නම් ගැටලුව තියෙන්නේ, තමන්ටනම් කිසිම අදාලත්වයක් නැති බවත්, තමන් කවුරුවත් එක්ක තරහත් නැහැ, හිතවත්කමකුත් නැති බවත්, ඒ අනුව සභාපතිතුමා එය ක්‍රියාත්මක කරන්න එතකොට මෙය යම්තාක් දුරකට හෝ සමනය වන බවත්, මෙහිදී ඇත්තටම මෙතෙන්දි බෙදීමක් වුනොත් මේක පරාජය කරන්න අත උස්සන්නේ නැති බවත්, නමුත් අපි මේක අනුමත කරන බවත්, අවංකවම හර්ෂණ මන්ත්‍රීතුමාත් එක්ක තමන්ට රණ්ඩු වෙන්න හේතුවක් නැති බවත්, මෙය අපේ පුද්ගලික ප්‍රශ්නයක් නොවන බවත්, ලෙඩේ තියෙන්න බෙහෙත් කරන්න ඕනි බවත්, එබැවින් ඔබතුමා ඒක ක්‍රියාත්මක කරන ලෙසත්, ඒකේ සංශෝධනයක් තියෙනවා නම් ඒකත් ක්‍රියාත්මක කරන ලෙසත්, එසේ නොමැතිව එක එක්කෙනාගේ ඉල්ලීම් ඉටු කරන්න මේක තවදුරටත් මෙහෙම යන්න බැරි බවත්, ඊට පස්සේ අරයා මෙයා ආරක්ෂා කරන්න ගිහිල්ලා මේ මන්ත්‍රීවරුත් එක්ක අපි මේක අස්සේ නැති ප්‍රශ්න ඇති කරගන්නා බවත්, ඒ තත්ත්වය ඇති වෙන්න ඕනේ නැති බවත්, ඒ අනුව සභාපතිතුමා නිවැරදි තීන්දුවක් ගන්නා ලෙස තමන් ඉල්ලා සිටින බවත්ය.

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් කෝසල විදුලි කාර්මිකයෙක් නොවන බැවින් ඔහුට රක්ෂණාවරණයක් තිබේද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසූයේ එසේ නොමැති බවයි.ඒ අනුව එතුමිය නැවතත් අදහස් දක්වමින් පැවසූයේ එයා කණුවක නැඟලා මොකක් හරි වෙලා මිය ගියා කියන්නකෝ ඒවගේ වුනොත් ,එහෙම වෙනවාට කියනවා නෙමෙයි, එතකොට මොකක්ද කරන්නේ යන්නයි.ගරු සභාපතිතුමා පැවසූයේ එතන ගැටලුවක් තියෙන බවයි.

මේකේ හැම තැනම ඒ වගේ තමයි යන්නත්, රියදුරෙක් නොවන එක්කෙනෙක් රියදුරෙක් ලෙස යෙදෙව්වොත්, එතන අපිට අඩුගානේ වාහනයට වන්දියක්වත් ගන්න බැරි බවත්, මනුස්සයෙක්ගේ ඇඟේ හැප්පිලා මැරුණොත්, ඒකවත් කරගන්න බැරි බවත්, එබැවින් මෙය හරි විදිහට පත් කරන ලෙසත්, ඒ තනතුරු වලට සෞඛ්‍ය කම්කරුවෝ නම් ඉන්නේ, ඒගොල්ලෝ ඒ තැන් වලට යොදවන්න, යොදවන්න පුළුවන් අයව ඉක්මනින් කරන්න යන්නත්, මෙය අවුරුද්දක් තිස්සේම කියන බවත් ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.සමරසේකර මැතිතුමිය පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුයේ එතුමිය එසේ පැවසුවද ඉහත ප්‍රායෝගික ගැටලු එන බවත්, දැන් ට්‍රැක්ටර් ටික එහෙම දුවන්නේ, ඉන්නේ ඔක්කොම සෞඛ්‍ය කම්කරුවෝ, ක්ෂේත්‍ර කම්කරුවෝ බවත්, එහෙම දැම්මොත් අපිට මේ පද්ධතිය දුවන්න බැහැ යන්නත් පැවසූ අතර එසේ පුරප්පාඩු වෙනවාට තමන් කැමති බවත්, ඒ පුරප්පාඩු සඳහා බඳවා ගන්නා ලෙසත් ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය සඳහන් කලේය.

එදා ගත්ත පිරිස ඉතා දක්ෂ බවත්, ඔවුන් සෞඛ්‍ය කම්කරුවොන්ට හිතන්නත් හොඳ නැති පිරිසක් බවත්, ඕනෑම හදිසි අවස්ථාවකදී ක්‍රියාකාරීව ඔවුන් කටයුතු කරන පිරිසක් බවත්, ඔවුන් එම තනතුරට ගත්තද ඉහළ මට්ටමක සේවාවක් නගර සභාවට ලබා දෙන බවත්, ඒක කාටවත් මේ විරුද්ධ වෙන්නත් බැහැ, නෑ කියන්නත් බැරි බවත්,ඔවුන් කාණු වලට දානවානම් එයට තමන් 100%ක් විරුද්ධ බවත්,ඔවුන් මේ තියෙන තනතුරුවලම ආරක්ෂා කරගෙන යන්න එක සුදුසු වන බවත් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා පැවසීය.

**මෙම අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.**

රුමී මන්ත්‍රීතුමා ඒ කට්ටිය හොඳයි කියලා දැන් බැලන්ස් කරගන්නා බවත්, පස්සේ පඩිය ගෙවන්න කිව්වාම විරුද්ධ වෙනවාද යන්නත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පවසන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමී මැතිතුමා පැවසුයේ තමන් ඊට විරුද්ධ වෙලා නැති බවයි.

එම පිරිස ගෙනල්ලා තියෙන්නේ අපි නෙමෙයි ඔබතුමාලා තමයි ගෙනල්ලා තියෙන්නේ යන්නත්, දැන් එයා හොඳයිලු, ඒ වගේම හොඳ රස්සාවත් දුන්නානම්, ඒ මනුස්සයාට සෞඛ්‍ය කම්කරු කියලා එතකොට කිව්වානම් මෙම ගැටළු නොවන බවත්, එහෙම කරේ මොන මඟුලකටද යන්නත්, ඕවා කරලා අන්තිමට අපිව අමාරුවේ දාන වැඩක් කර ඇති බවත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පවසන ලදී.

මෙම තනතුරුවලට රියදුරන් බඳවාගන්නා ක්‍රියාව පළාත් සභාවෙන් සිදු විය යුතු වැඩක් බවත්, නමුත් එම අයගෙන් මේ වැඩේ කෙරෙන්නේ නැති බවත්, මෙම අඩුපාඩු සඳහා බඳවාගැනීමට සංශෝධන කිරීමට පළාත් සභාවේ, ආණ්ඩුකාරතුමියටවත්, කොමසාරිස්තුමාට වුනත්, කිසිසේත්ම බලයක් නැති බවත්, ඒ බඳවා ගැනීමේ පටිපාටිය කෙරෙන්නේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් බවත්, නමුත් ඒගොල්ලොත් එක්කත් තමන් කතා කළ බවත්, එහිනුත් මෙයට හරි උත්තරයක් නොදෙන බවත්, මෙම තනතුරුවලට සේවකයින් බඳවා ගැනීම් වලදී ඒ තීරණ කෙරෙන්නේ එහින් බවත්, එම වගකීම ඉහළට භාරගන්නේ නැති බවත්, තමන් සිතන ලෙසට එහෙන් එය කෙරෙන පාටකුත් නැති බවත්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් තීන්දු තීරණ ප්‍රමාද බවත්, නමුත් අපි මේක මෙතන කතා කරන බවත්, නමුත් ඊට

අදාළව අපිට උත්තරකුත් නැති බවත්, එබැවින් මෙය අදට මෙතනින් නතර කිරීම සුදුසු බවත්, මෙහි කාලය ගත වෙන බැවින් තේරුමක් නැති බවත් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා පවසන ලදී.

මේ සම්බන්ධව ඊළඟ සභාවාරවලදීත් මේ විදිහටම කතා කරන්න සිදු වනු ඇති බවත්, මේ සඳහා කාලය නාස්ති වෙන බැවින් මෙයට බෙදීමකට යාම සුදුසු බවත්, ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පවසන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා ඉහත 07:01:12 යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ මතය විමසීම වෙනුවෙන් විවෘත ඡන්ද විමසීමක් පැවැත්වීමට කටයුතු කරන ලෙස ලේකම්තුමියට දැනුම් දෙන ලදී.

ඉහත 07:01:12 යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ මතය විමසීම වෙනුවෙන් පැවති විවෘත ඡන්ද විමසීම අනුව එකී යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් 08 දෙනෙකුද, එනම්,

01.ගරු සභාපති එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමා
02. ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් වන්දන මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

එකී යෝජනාවට විපක්ෂව ගරු සභිකවරුන් 04 දෙනෙකුද , එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
03. ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය
04. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා

එකී යෝජනාවට ඡන්දය දීමෙන් වැළකී සිටි ගරු සභිකවරුන් 02 දෙනෙකුද , එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා

ලෙස ගරු සභිකවරුන් තම ඡන්දය ප්‍රකාශ කළ අතර මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා යන ගරු

සභිකවරුන් මෙම අවස්ථාවේ සභා ගර්භයේ නොසිටි සභිකවරුන් වේ.ඒ අනුව ඉහත 07:01:12 යෝජනාව වැඩි ඡන්ද 04 කින් සභා සම්මත විය.

**07:01:13** 2026 මැයි මස දෛනික වැටුප් වෙනුවෙන් රු.1,695,461.89ක් ගෙවීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහාද මතය විමසීම වෙනුවෙන් බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී එම්.ඒ.එම්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා යෝජනා කළ අතර එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා ඉහත 07:01:13 යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ මතය විමසීම වෙනුවෙන් විවෘත ඡන්ද විමසීමක් පැවැත්වීමට කටයුතු කරන ලෙස ලේකම්තුමියට දැනුම් දෙන ලදී.

ඉහත 07:01:13 යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ මතය විමසීම වෙනුවෙන් පැවති විවෘත ඡන්ද විමසීම අනුව එකී යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් 08 දෙනෙකුද, එනම්,

01.ගරු සභාපති එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමා
02. ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

එකී යෝජනාවට විපක්ෂව ගරු සභිකවරුන් 03 දෙනෙකුද , එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
03. ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය
04. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා

එකී යෝජනාවට ඡන්දය දීමෙන් වැළකී සිටි ගරු සභිකවරුන් 02 දෙනෙකුද , එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා

02. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා

ලෙස ගරු සභිකවරුන් තම ඡන්දය ප්‍රකාශ කළ අතර මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා යන ගරු සභිකවරුන් මෙම අවස්ථාවේ සභා ගර්භයේ නොසිටි සභිකවරුන් වේ.ඒ අනුව ඉහත 07:01:13 යෝජනාව වැඩි ඡන්ද 04 කින් සභා සම්මත විය.

**07:01:14** 2026 අප්‍රේල් මස ඉන්ධන බිල්පත් පියවීම වෙනුවෙන් BKJ Petroleum වෙත රු.1,149,038.52 ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:15** 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**මෙම අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාව වෙත ආපසු පැමිණියේය.**

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ දැනට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත ප්‍රකාරව දැනට තොරතුරු නිලධාරි ලෙස කටයුතු කරනු ලබන්නේ ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරිනිය බැවින් එම තනතුරට ඊළඟට පත්වන නිලධාරියා /නිලධාරිනිය තොරතුරු නිලධාරි ලෙස පත් කිරීම සුදුසු වන බවයි. ගරු සභාපතිතුමා පැවසුයේ ඒ අනුව කටයුතු කිරීම සුදුසු වන බවයි.

ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි තනතුරට ඊළඟට පත්වන නිලධාරියා /නිලධාරිනිය තොරතුරු නිලධාරි ලෙස පත් කිරීමට ගරු සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**07:01:16** සභාව වෙත ට්‍රැක්ටර් රථ රියදුරන් 03 දෙනෙකුගේ සේවය මිලදී ගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:17** සභාව වෙත ට්‍රැක්ටර් රථ රියදුරන් 03 දෙනෙකු දෛනික වැටුප් ගෙවීමේ පදනම මත බඳවාගැනීමට සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**මෙම අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා ආපසු සභාවට පැමිණියේය.**

**07:01:18** බලන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීමේ කටයුතු සඳහා 2026 මැයි මස ගෙවීම රු.1,098,000.00 ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සඳහන් කලේ කසළ එකතු කිරීම සම්බන්ධව ගැටළු රාශියක් පවතින බවත්, කිරිඳිගල උඩකන්ද කරවකැටිය මාර්ගවල ට්‍රැක්ටරය යන්නේ නැති බවට මහජන පැමිණිලි ලැබෙන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා සඳහන් කලේ, කසළ එකතු කරන මනුස්සය එකතු කරද්දී ට්‍රැක්ටරේ යන බවත්, ට්‍රැක්ටරේ පස්සෙන් දුවන්න ඕනි බවත්,පසුව තමන් එය දුටු බැවින් රියදුරුට බැන්න බවත්ය.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, මෙම කසල එකතු කිරීම සම්බන්ධව සෞඛ්‍ය කමිටුවේදී සාකච්ඡා කළ බවත්, එහිදී ඒ අදාල කොන්ත්‍රාත් කරන මහත්මියත් කැඳවා සාකච්ඡා කළ බවත්, ඔවුන්ගෙ සේවකයො, කම්කරුවො නෙමෙයි, සභාවේ රියදුරු මහත්තුරු මේ විදියට වැඩ කරන බව එහිදී ඇය ප්‍රකාශ කල බවත් පැවසීය.

එතුමා වැඩිදුරටත් පැවසුයේ තමන් කලින් මෙහි වැඩ කරන දවස්වල 2020ට කලිනුත් උදේ හවස ට්‍රැක්ටරේ දෙවරක් බැංකියවත්තට යන බවත්, දැන් එය හරිනම් 04 වතාවක් වත් විය යුතු බවත්, මෙහි රියදුරෝ හදාගත්ත ක්‍රමයක් තිබෙන බවත්, ඒක වෙනස් කළ යුතු බවත්, කොන්ත්‍රාත් කරන මහත්මියගේ ගැටළුවක් නොවන බවත්, අපේ රියදුරන් තමයි හැදෙන්න ඕනෙ යන්නත්, ඒගොල්ලො හදාගත්ත උපසංස්කෘතියක් මේක අස්සෙ තියෙන බවත්, ඒක නැතිවෙන්න අවශ්‍ය බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**විශේෂ යෝජනා-**

**07:01:19** වටවල සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතු රු.500,000ක් වටිනා පොහොර කැබලි කරන යන්ත්‍රයක් සහ පොහොර හලන යන්ත්‍රයක් ලබාදීම වෙනුවෙන් එම ආයතනය වෙත ඉල්ලීම් කරනු ලැබූ ඉල්ලීම්වලින් මසකට පොහොර පැකට් 10ක් ලබාදීම යන කාරණාව සඳහා පමණක් පළාත් පාලන කොමසාරිස් අනුමැතිය ලැබී ඇත.එබැවින් ඉදිරි කටයුතු පිළිබඳව තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසූයේ ඉහත ආයතනය මඟින් රු.500,000ක් වටිනා පොහොර කැබලි කරන යන්ත්‍රයක් සහ පොහොර හලන යන්ත්‍රයක් ලබාදීම වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ නොමිලේ සේවා ලබා දීමේ ඉල්ලීම් පළාත් පාලන කොමසාරිස් අනුමැතිය වෙත යොමුකළ බවත්,ඒවා අතුරින් ගැටළුවක් නොවන්නේ පොහොර ලබා දීම බැවින් ඒ පිළිබඳව නැවත සභා තීරණයක් ලබා ගන්නා ලෙස දැනුම් දී ඇති බවත්ය.එබැවින් එම ආයතනය වෙත මසකට කිලෝ 10 පොහොර පැකට් 10 බැගින් වර්ෂ 3ක් සඳහා නොමිලේ පොහොර ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව එකී සංශෝධිත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙහිදී ගරු සභාපතිතුමා පැවසුයේ තවත් විශේෂ යෝජනාවක් ලෙස පෙට්ටිගල මාර්ගය අතිපූජ්‍ය වටද්දර ඥානේශ්වර හිමියන් නමින් නම් කිරීම සම්බන්ධව ගරු පූජා ගැටඅරළුවේ සංඝරක්ඛිත ස්වාමීන් වහන්සේ විසින් ඉල්ලීමක් කර ඇති බැවින් එකී මාර්ගය නම් කිරීමට යෝජනා කරන බවයි.

එම ලිපිය මඟින් 2024.01.25 වැනි පෝය දින අපවත්වී වදාල ස්‍යාමෝපාලී මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ සබරගමුව පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක, දර්ශනවේදී, රාජකීය පණ්ඩිත, වටද්දර ශ්‍රී ඥානේශ්වර නායක ස්වාමීන් වහන්සේගෙන් සම්බුද්ධ ශාසනයට සහ බෞද්ධ ලෝකයාට සිදු වූ සේවාව අති විශාල බවත්, කූරගල මහා පුදබිම බෞද්ධ ලෝකයට දායාද කිරීම ඉන් එක් ප්‍රධාන කරුණක් පමණක් බවත්, බෝම්බුව බෝධි මණ්ඩලාරාම පුරාණ විහාරස්ථානයේ වැඩසිටිමින් නගරවාසීන්ට මෙන්ම ප්‍රදේශයට සිදුකළ ශාසනික සේවය අමතක කළ නොහැකි බවත්, එසේ හෙයින්, මෙම මහඟු සේවාවන්ට උපහාරයක් ලෙස දැනට පෙට්ටිගල පාර යනුවෙන් භාවිත කරනු ලබන මාර්ගය "වටද්දර ශ්‍රී ඥානේශ්වර නාහිමි මාවත" යනුවෙන් නම් කිරීමට අවශ්‍ය කටයුතු පිළියෙල කර එම කටයුත්ත ඉටුකර දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත්,එහි නාගරික මන්ත්‍රීවරු සියලු දෙනාගේ සහයෝගය ලැබෙතැයි අපේක්ෂා කර ඇති බව දන්වා ඇති බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා සඳහන් කලේ අපි කව්රුත් දන්න පරිදි මහානායක ස්වාමීන් වහන්සේ බෞද්ධ ශාසනයට ඉමහත් සේවාවක් සිදු කළ බවත්, එබැවින් මහානායක ස්වාමීන් වහන්සේගේ ඉල්ලීමට සභාවේ සියළු දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙස ගෞරව පූර්වකව ඉල්ලා සිටින බවත්ය.

මෙහිදී ගරු උප සභාපතිතුමා පැවසුවේ මෙය විශේෂ යෝජනාවක් ලෙස ඇතුළත් කිරීම කිසිදු ගැටළුවක් විරෝධතාවක් නොමැති වුවද එහි නීතිමය තත්වය අනුව වීථි නම් කිරීම් පනත අනුව ගැසට් කිරීමේදී න්‍යාය පත්‍රය යොමුකළ යුතු බැවින් ඒ සඳහා විධිමත් පරිදි න්‍යාය පත්‍රයේ සඳහන් යෝජනාවක් විය යුතු බැවින් ඊළඟ සභා වාරයට ඇතුළත් කර සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු වන බවයි.ඒ අනුව ගරු සභාපතිතුමාද පැවසුයේ ඊළඟ සභා වාරයට විධිමත් පරිදි න්‍යාය පත්‍රයට ඇතුළත් කර සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු වන බවයි.

**07:02** ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා

**07:02:01** ඉත්තෑගලහේන මාර්ගය නඩත්තු කිරීමට යොජනා කරමි.

ඉහත සඳහන් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාගේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ ශෛලතලාරාම විහාරස්ථානය කියන්නේ බලන්ගොඩ හඳුන්වා දිමට ඇති සංකේතයක් වැනි බවත්, ගරු ආනන්ද මෛත්‍රිය මහානායක හාමුදුරුවෝ ,සිරිමාවෝ බණ්ඩාරනායක මැතිතුමිය ,බලන්ගොඩ මානවයා, වැනි සංකේත සමඟ ඊට ශෛලතලාරාම විහාරස්ථානය අලුතින් එකතු වී ඇති බවත්, ඒ අනුව මුගුණමලය මාර්ගය, ඉත්තෑගලහේන මාර්ගය, බුද්ධ ජයන්ති මාර්ගය ආදී බොහොමයක් මාර්ග ශෛලතලාරාම පන්සලට යාමට පාවිච්චි කරන බවත්, නමුත් වෙසක් උත්සවයට කලින් එම මාර්ග ටික පොඩ්ඩක් එළි කරලා දෙන්න කියලා දැනුවත් කළ බවත්, නමුත් එය අපිට කරගන්න බැරි වුණ බවත්, කියන්න කණගාටු බවත්, ඉත්තෑගලහේන මාර්ගය පන්සලට පයින් යාමට හැකි පහසු මාර්ගයක් බවත්, තමන්ට කතා කරලා ඒ මිනිස්සු ටික කිව්වට පස්සේ, බැරිම තැන ඒ මිනිස්සු පුළුවන් විදිහට එළි කරගත් බවත්ය.

තවදුරටත් අදහස් දක්වමින් එතුමා පැවසුයේ ඉත්තෑගලහේන මාර්ගයේ කන්ද වැඩි බවත්, ආනන්ද සභාපතිතුමා ඉන්න කාලේ මෙහි පඩිපෙල් ටික කපලා, කොන්ක්‍රීට් කරලා දීලා ඇති බවත්, ඇත්තටම මෙහි පාට පක්ෂ බේද මොනවත් නොබලා මේකට ප්‍රමුඛතාවය ලබා දෙන ලෙසත්, මුදල් කමිටුවෙදී කර්මාන්ත කමිටුවේදී මෙය අනුමත කර ඇති නමුත් මේ වැඩේ සිදු නොවන බවත්, ලොකු වැඩ ඕනේ නැහැ, ප්‍රමුඛතා ගත කර මෙවැනි නඩත්තුවක් හරි කරන්න වැඩපිළිවෙලක් හදලා දෙන ලෙසට තමන් ඉල්ලා සිටින බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02:02** ඉරිදා පොල දිනයන්හි පොල අසල පාරිබෝගික ජනතාවට ජනතාවට වාහන නැවැත්වීමට ඉඩ නොදීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාගේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ඉරිදා පොල පැවැත්වෙන දවසට එම ස්ථානය ජනාකීර්ණ වන බවත්, වෙනත් ප්‍රදේශයන්හි පොළ පැවැත්වෙන බැවින් පිටස්තර පුද්ගලයෝ දැන් සීමිත කොට්ඨාශයක් බලන්ගොඩ පොළ භූමියට පැමිණෙන බවත්, එවිට බලන්ගොඩ නගරයට එන ජනගහනය අඩු වුණාම මේ බලන්ගොඩ ව්‍යාපාරිකයන්ට එයින් පහර වදින බවත්, ඒ අනුව ඉරිදා පොළෙන් පිරිසක් ජීවත් විය යුතු බවත්, නමුත් පොළ පිවිසුමේ ස්ථිරවම ත්‍රිරෝද රථ සඳහා අනුමැතිය දීලා තියෙනවාද කියලා තමන් නොදන්නා බවත්, පසුගිය දිනෙක එක් අයෙකුගේ වාහනය එතන නවත්වා ආපසු පැමිණීමේදී හාල් කවරය නැති වී ඇති බවත්, එම ස්ථානයෙන් ත්‍රිරෝද රථ නවත්වා මාර්ගය හරස් කර ඇති බවත්, අපි දෙපාර්ශවයම පිළිබඳව බැලිය යුතු බවත්, එන

පාරිභෝගිකයාට වාහනයක් නතර කර පොළට යාමට නොහැකි නම් ඒ පිළිබඳ අනිවාර්යෙන් සලකා බැලිය යුතු බවත්, එම ස්ථානයේ ටිකට් කැඩීමට ගියත් එය කරන්නත් බැරි බවත්, එතන පාක් එකක් කියලා ඒකාධිකාරයක් පවත්වාගෙන යන ස්ථානයක් තිබෙන බවත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පැවසුයේ, පොළට එන ව්‍යාපාරිකයන්ට බඩු ටික පටවන්නවත් ත්‍රීවිල් පාක් එකේ ඉන්න අය දෙන්නේ නැති බවත් ඔවුන්ට තර්ජනය කරන බව පවසන බවත්, නමුත් සභාව ලොරි ඇතුලට දානවාට මුදල් අය කරන බවත්ය.

මේ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසුයේ ඉහත කරුණු සියල්ලම සත්‍ය බවත්, ත්‍රිවිල් පාර්ක් එක නියාමනය විය යුතු බවත්, එසේම එම ස්ථානයේ වෙනම ආරක්ෂාව දමාගෙන වෙනමම පුද්ගලයෙක් සිටින බවත්, ඔහුට තියෙන්නේ මොන හස්තයක්ද යන්න නොදන්නා බවත්,එතන වෙනත් අයකුට වාහනයක්වත් දාන්න දෙන්නේ නැතිව ආරක්ෂකයෝ දාගෙන පවත්වාගෙන යන බවත්,එය අනිවාර්යයෙන්ම සභාවක් ලෙස නියාමනය විය යුතු බවත්ය.

එස්.යූ.සී ජයනක මැතිතුමා පැවසුවේ පාරිභෝගිකයන්ගේ වාහන පමණයි ලෙස පුවරු සවිකිරීම සුදුසු බවට යෝජනා කරන බවයි. ගරු සභාපතිතුමා පැවසුයේ එසේ පුවරු සවි කිරීම සුදුසු වන බවත්, එම ස්ථානයේ ත්‍රීවීල් පාර්ක් එකක් නොමැති බැවින් ඒ පිළිබඳව සොයා බලන ලෙසයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03 ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා**

**07:03:01** 2026 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් කල්තොට පාර කුමාරගම දෙවෙනි පටුමග මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසුවේ හිටපු සභාපති කේ.ජී පේමදාස මැතිතුමාට ඡන්ද දීපු අය සිටින කුමාරගම දෙවෙනි පටුමග මාර්ගය, නගර සභාවට විශාල වැඩ කොටසක් කළ එතුමාගේ කොට්ඨාසයේ තිබෙන මාර්ගයක් බවත්, අපි වැඩ කළත් කිසි දෙයක් කර නොදුන් බවට එම ජනතාව පවසන බවත්, ඒ අනුව තමන්ගේ පෞද්ගලික මන්ත්‍රී

ප්‍රතිපාදන රු.500,000 යොදලා මෙම මාර්ගය සංවර්ධනය කරලා දෙන ලෙස යෝජනා කරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා ,එසේ පැවසූ අයගේ නම් ඉදිරිපත් කරන ලෙස පවසන ලදුව, ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසූයේ එසේ නම් පැවසීම කළ නොහැකි බවත් පේමදාස මැතිතුමාට මෙම මාර්ගය සංවර්ධනය කරදීමට ලිපියකුත් ලබා දුන් බවත්, දහ පාරකට වැඩිය තමනුත් මේ පිළිබඳ පැවසූ බවත්, නමුත් කරන්නම් කරන්නම් කිව්වට සිදුකර ලබා දුන් නොමැති බවත්, තමන් ගමේ මන්ත්‍රීවරයා ලෙස එම ජනතාව තමන්ට මෙම ඉල්ලීම ලබාදුන් බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා පැවසුවේ කාගෙන් කාලා හරි මට තාත්තා කියපන් පුතේ යනුවෙන් කතාවක් තිබෙන බැවින් තමනුත් කියන්නේ කාගෙන් හරි කමක් නෑ වැඩේ කරගෙන තමන්ට ඡන්දෙ ලබා දෙන ලෙස බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

**07:04:01** බලගහමුල සමුපකාර සමිතිය ඉදිරිපස පාර “ ගාර්දියේ සුගතදාස සිල්වා ” මාවත ලෙස නම් කිරීමට සහා අනුමැතිය ලබාගැනීම හා ඊට අදාලව අවශ්‍ය සිදුකිරීමට යෝජනා කරමි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසූයේ සුගතදාස සිල්වා මැතිතුමා 1972 සිට මන්ත්‍රීවරයෙක්,සභාපතිවරයෙක්, උපසභාපතිවරයෙක් ලෙස මෙම සභාවේ කටයුතු කළ බවත්, එතුමා තමාගේ පක්ෂයේවත් මොකකවත් නොමැති වුවද එම ප්‍රදේශවාසීන් තමන් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ බැවින් මෙය සභාවට යොමු කළ බවත්, කොට්ඨාසයේ මන්ත්‍රීවරයා වෙන්නේ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා බවත්, නමුත් කොට්ඨාසයක් දිනලා ආපු නැති නිසා සමස්තයක් ලෙස තමන් බලන බැවින් මෙම ඉල්ලීම භාර ගත් බවත්, කවුරුන් හෝ ඒ පිළිබඳ වැරදියට නොසිතන ලෙසත්, ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලීම් කරන බවත්ය.

එමෙන්ම විශේෂ කාරණාවක් පවතින බවත් පසුගිය සභාවේ දී සමරසිංහ මැතිතුමාගේ නම කියවුන බවත්, හින්දු විද්‍යාලය සෑදීමට එතුමාද මූලික වූ බව පැවසූ බවත්, මෙම ලිපිය අනුව හින්දු විද්‍යාලය සෑදීමට මෙතුමාද මූලික වී ඇති බව පවසා ඇති බවත්, ඒ අනුව 1965 හින්දු විද්‍යාලයේ පටන් ගැනීම සිදු වී ඇති බවත්,එතුමන්ලා වෙත සභාවෙන් ඉදිරිපත් කරන

නිර්ණායයක අනුව මෙම නාම පුවරුව සභාවේ වැයකින් තොරව කරදෙනු ඇති බවත් එදිනට සියළු දෙනා පැමිණෙන ලෙසත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05 ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය**

**07:05:01** මහජන පොළ සහ බස්නැවතුම්පළ වැසිකිළි නඩත්තු කිරීමෙන් අනතුරුව මාසික ආදායම් විස්තරය ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමි.

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මහජන පොළ සහ බස්නැවතුම්පළ වැසිකිළි වැසිකිළිවල මාසික ආදායම් විස්තරය පහත පරිදි ගරු සභාපතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදී.

| මාසය | බස්නැවතුම්පොළ පොදු වැසිකිළි ආදායම ( රු.) | මහජන පොළ පොදු වැසිකිළි ආදායම (රු) |
|---|---|---|
| 2026 ජනවාරි | 332,210.00 | 26,180.00 |
| 2026 පෙබරවාරි | 277,340.00 | 66,890.00 |
| 2026 මාර්තු | 175,580.00 | 26,000.00 |
| 2026 අප්‍රේල් | 314,320.00 | 26,000.00 |
| 2026 මැයි | 351,520.00 | 26,000.00 |

ඉහත යෝජනාව සම්බන්ධ කරුණු පැහැදිලි කිරීම ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සිදු කරනු ඇති බව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පවසන ලදී. ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුවේ මහජන පොළ පොදු වැසිකිළියේ ආදායම එක්වරම පෙබරවාරි මාසයේ වැඩිවෙලා තිබියදී රුපියල් 25,000ක මුදලකට ටෙන්ඩර් කරලා ලබාදීමට සභාව තීරණය කර ඇති බවයි.ඒ සඳහා පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසුයේ බස්

නැවතුම්පොළේ පොදු වැසිකිළිය වැසූ බැවින් එම පිරිස පොළ පොදු වැසිකිළියට ගොස් ඇති බැවින් එසේ ආදායම වැඩි වී ඇති බවයි.

**07:05:02** බස් රථවල මුදල් එකතු කිරීම නගර සභාව භාරයට ගත් පසු මාසික ආදායම වෙන වෙනම ඉදිරිපත් කරන ලෙස යෝජනා කරමි.(2026 ජනවාරි සිට)

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පෞද්ගලික බස්ගාල් ගාස්තු අයකිරීමේ මාසික ආදායම් විස්තරය පහත පරිදි ගරු සභාපතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදී.

| මාසය | ආදායම ( රු.) |
|---|---|
| 2026 ජනවාරි | 317,800.00 |
| 2026 පෙබරවාරි | 282,400.00 |
| 2026 මාර්තු | 277,000.00 |
| 2026 අප්‍රේල් | 263,700.00 |
| 2026 මැයි | 260,600.00 |

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසුවේ මෙහි ආදායම කොහොමද කියන එක තමන් දන්නා බවත්, සභාපතිතුමාට ද මේ ගැන දැනගන්න ඕනි නම් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් දෛනික වාර්තාවක් රැගෙන දිනපතා ධාවනය වන බස් රථ ප්‍රමාණය බලා ගත හැකි බවත්, කාටවත් අපහසුතාවයට පත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවත්, බස් ටිකෙන් ලැබෙන මුදල් සභාවට ලැබීම අපේක්ෂා කරන බවත්, කිසිදු පහසුකමක් මෙයට ලබාදීලාවත් නොමැතිව මාසෙකට රු.400,000ක පමණ ආදායමක් ගන්න පුළුවන් තැනක් බවත්, තමන් මෙහි එන ආදායම ගැන දැනගත්තට ඒක සභාවට එන්නේ නැති බවත් සභාපතිතුමාද කීප තැනකින් ආදායම පිළිබඳව විමසීම් කර තිබූ බවත්, ඒ අනුව බස් 170 පමණ පවතින බවත්, සභාවට හරි ආදායමක් ලබා ගත යුතු බවත්,

එසේම තමන් මෙම යෝජනාව සභාවට දැමූ විට කෙනෙකු තරංගනී මෙම යෝජනාව දාලා තියෙනවා කියලා එම අදාළ පුද්ගලයාට ප්‍රශ්නයක් වන බව මෙහි අයෙකු පවසා ඇති

බවත්,ඔහු එම ටිකට් කැඩීමට යොදවා ඇති අය බේරගන්නම් ලෙස පවසා ඇති බවත්, එසේ බේරගන්නම් කියා කියන්න බැරි බවත්, අනිත් දවසේ නමම කියන බවත්, තමනුත් සභාවට මුදල් ගෙවද්දි මෙතනින් බලාපොරොත්තු වෙන දෙයක් පවතින බවත්, පාකින් එකටත් මුදල් ගෙවන බවත්, තමන් මෙම යෝජනාව දැමීම සම්බන්ධව වැරදි ප්‍රතිරූපයක් මවාගෙන සිටින බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුවේ ආදායම් විශ්ලේෂණ වාර්තාව අනුව ආදායම ක්‍රමයෙන් අඩුවී ඇති බවත්, ආදායම සම්බන්ධ වගකීම තිබෙන්නේ ලේකම්ට බවත්, ආදායම් පරිපාලක, ගණකාධිකාරී මෙය දැක්කේ නැද්ද යන්නත්, ආදායම් පරිපාලක සභාවට පැමිණෙන්නේ නැති බවත්, මෙම වාර්තාව අනුව දිනකට සාමාන්‍යයෙන් බස් රථ 80 ක් පමණ ධාවනය කර ඇති බවත්, නමුත් බස් රථ 170ක් පවතින බවට පවසන බවත්, මේවා ගැන නොබලා අදායම් පරීක්ෂක මෙහි පොල් ගානවද බම්බු ගහනවාද කියලා නොදන්නා බවත්, මුගුණමලේ මාර්ගය නඩත්තු කරදීමට තමන් අවුරුද්දක් තිස්සේ ඉල්ලීම් කළද එයට මුදල් නෑ කියන බවත්, මෙසේ සිදු වෙද්දී ඇත්තටම සභාවට මුදල් එන්නේ කොහෙන්ද යන්නත්, හරි නම් නගර සභාවට මේ සිදුවී ඇති පාඩුව ආදායම් පරිපාලකගෙන් අය කර ගත යුතු බවත්ය.

ගරු උපසභාපති නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ මෙම පවසන යෝජනා පිළිගැනීමට සිදුවන බවත්, ඇත්තටම ආදායම් අඩු වෙනවා නම් ආදායම් පරීක්ෂක ඒ පිළිබඳව බැලිය යුතු බවත්, එසේ අඩුවන්නේ සභාවේ ආදායම් බැවින් ඒ පිළිබඳව හේතු සෙවිය යුතු බවත්, තවත් කාරණාවක් ලෙස බස් රථ ගාල් ගාස්තු අය කිරීම නැවත ටෙන්ඩර් කරන්න යනවා කියලා මතයක් පතුරවන්න හදන බවත්, මෙහි එක්තරා පුද්ගලයෙකු සමග කුමන්ත්‍රණයක් යන බවත්, නමුත් සභාව ලෙස මෙහි උපරිම ආදායම ලබා ගැනීමට නිවැරදිව අධීක්ෂණය විය යුතු බවත්ය.

මෙම ආදායම අඩුවීමට හේතුව පරීක්ෂණයක් සිදුකර ඊළඟ සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවත් ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා යෝජනා කළ අතර, එතුමා වැඩිදුරටත් පැවසූයේ සභා වාරවලදී මේවා පිළිබඳ කතා කරන බවත්,ඊළඟ සභාවට පැමිණිලා ආපසු කතා කිරීම තේරුමක් නැති බවත්, ඉහත ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමාගේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**07:05:03** වරිපනම් අංක ලබාගැනීමේ දී සිදුවන ප්‍රමාදය වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම හා ගොඩනැගිලි පරීක්ෂණ ආයතනයේ නියෝජිතයෙකු බළන්ගොඩ ප්‍රදේශයට සම්බන්ධ කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට යෝජනා කරමි.

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුවේ මෙම යෝජනාව සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා යොමු කිරීම සුදුසු බවයි.මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුවේ වරිපනම් අංක ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යැවීම හේතුවෙන් එහිදී විශාල ප්‍රමාදයක් සිදුවන බවත්,හදිසියට පුද්ගලයකු ජලය ලබා ගැනීමට පැමිණියත් වරිපනම් ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුවට යවන බවත්, සභාවේ ආදායම් අංශයෙන් මේ පිළිබඳව විමසීමේදී වරිපනම් අංකය මෙහෙන් දුන්නාම තක්සේරු දෙපාර්තමේන්තුවේ අංකය සමඟින් නොගැලපීම හේතුවෙන් එසේ සිදු කරන බව පැවසූ බවත්, ඒ අනුව දැන් මුළු දිස්ත්‍රික්කයේම වරිපනම් අංක ලබා දෙන්නේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් බවත්ය.

එතුමා වැඩිදුරටත් පැවසූයේ ගොඩනැගිලි පර්යේෂණ දෙපාර්තමේන්තුවේ හා තක්සේරු දෙපාර්තමේන්තුවේ එක් නිලධාරියකු සතියකට වරක් හෝ මෙම ආයතන පරිශ්‍රය තුළ ස්ථානයක් ලබාදී අවශ්‍ය පහසුකම් ලබාදී තබා ගැනීමට හැකි නම් එලෙස ජනතාවට මේ සඳහා වැය කිරීමට සිදුවන කාලය අඩු කරගත කරගත හැකි බවත්, ජනතාව බොහෝ විට ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට වාහන රැගෙන ගොස් එහි රස්තියාදු වී ආපසු පැමිණෙන බවත්, මෙය කිරීමට හැකිනම් එය වටිනා බවත් ඒ අනුව මෙම කරුණු පිළිබඳව සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කරන ලෙසත්ය.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් වරිපනම් අංක ලබා දීම සහ එය ලබාදීමට නගර සභාවට ඇති නොහැකියාව පිළිබඳව විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසූයේ ඒ පිළිබඳ නීතිමය තත්ත්වය නොදන්නා බවත් නිවැරදි ක්‍රමවේදය වන්නේ දැනට භාවිතා කරන ක්‍රමවේදය බවත්ය. අනතුරුව ලේකම්තුමියගෙන් මේ පිළිබඳ කරුණු පැහැදිලි කර ගැනීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උපසභාපති නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ඒ අනුව අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව නැවත ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05:04** 2026 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ වැසිකිළි ආධාර ලබාගැනීමේ යෝජනාව යටතේ එක් අයෙකුට රු 50,000/- බැගින් පහත නම් සඳහන් අය වෙත එම ආධාර ලබාදීමට කටයුතු යෝජනා කරමි.

| අනු අංකය | නම | ලිපිනය |
|---|---|---|
| **01** | යූ.කේ.ඩී.සේපාලී මිය | ජල සම්පාදන මණ්ඩල පාර කිරිදිගල,බලන්ගොඩ |
| **02** | ජී.සම්පත් මයා | ඉත්තගලහේන ,මුගුණමලය,බලන්ගොඩ |
| **03** | ජේ.මෙරී ස්ටෙලා මිය | තොසිල ගාර්ඩින්,වැලිහරනාව පාර,කිරිදිගල,බලන්ගොඩ |
| **04** | ඒ.පිලෝමිනා මිය | 23 බුද්ධ ජයන්ති මාවත,තුඹගොඩ,බලන්ගොඩ |
| **05** | තාල්ඩීන් ඩිස්නි මයා | ඉත්තගලහේන,මුගුණමලය,බලන්ගොඩ |
| **06** | ඩී.එම්.කපිල මහතා | දොරවෙල,බලන්ගොඩ. |

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාවට සම්බන්ධව නම් ටික ලබාදී කාලයක් ගතවෙන බැවින් එය කඩිනමින් ඉටුකර ලබාදෙන ලෙස ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසූ අතර ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ මේ සඳහා අයවැයෙන් මුදල් වෙන්කර නොතිබූ බැවින් එතුමියගේ පෞද්ගලික මුදල් ප්‍රතිපාදනවලින් මුදල් වෙන් කිරීමට යෝජනා කර ඇති බවත්, මීට අදාළව මෙම පුද්ගලයන් අඩු ආදායම්ලාභී බවට සහතිකය සහ මීට කලින් ආධාර ලබා නොගැනීම පිළිබඳව සහතිකය කඩිනමින් ගෙනැවිත් ලබා දෙන බවත් ඒ අනුව හැකි ඉක්මනින් මෙම යෝජනාව ක්‍රියාත්මක කරන ලෙසත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06** **ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

**07:06:01** සතිපොළ භූමියේ අඩුපාඩු ආදිය නිරීක්ෂණය කිරීමට මන්ත්‍රී කණ්ඩායම නිරීක්ෂණයක යෙදීමට යෝජනා කරමි.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා පැවසුයේ සතිපොළේ අඩුපාඩු දැකීමට එහි අනිවාර්යයෙන්ම යා යුතු බවත්, මන්ත්‍රී කණ්ඩායම එහි යා යුතු බවත්, ජල ප්‍රශ්නයක් තිබෙන බවත්, පොළ පිටුපසට වන්නට පොළ කුටි වල වෙළෙන්දෝ නැති වුණත් පොළ මැද පේමන්ට් එකෙත් බඩු ටික දාලා මිනිස්සුන්ට ගමන් කිරීමට නොහැකි පරිදි පිරී පවතින බවත්, මඩුවල ඉටිරෙදි ගහලා ඒවායෙන් වතුර වැටෙන බවත්,සෑම පොළ කුටියකම සමානව වෙළදාම් කිරීමට යොමු කරන්නේ නම් එය සුදුසු වන බවත්, එසේ නොමැති නම් එම හිස්ව පවතින කුටි කුලියට ලබාදීම හෝ කිරීම සුදුසු බවත්, සම්පත් පියස කඩකාමර ටෙන්ඩර් කිරීමේදී විශාල පිරිසක් කඩකාමර ඉල්ලීම් කළ බැවින් නගරයේ කඩ නැතුව බොහෝ පිරිසක් සිටින බැවින් ඔවුන්ට හෝ ඒවා කුලියට ලබාදිය හැකි බවත්ය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසූයේ පොළ මඩු කුලී පිළිබඳව වෙළඳුන් පැවසූ බවත්, සමහරු ඈත ප්‍රදේශවලින් පැමිණ කුඩා දේවල් ටිකක් තබාගෙන ඉන්නවා එයාලටත් මේ 450 මුදල ගන්නා බවත්, ඒ මිනිස්සු පව් යන්නත්, ඒ අනුව පේළි අනුව වර්ග කර අය කරන්නේ නම් සුදුසු බවත්, ත්‍රිවිල් පාර්ක් එකක් සම්බන්ධ ගැටලුවක් කලින් මතු කළ බවත් එය ප්‍රේක්ෂකාගාරය දෙසට දැමීම සුදුසු බවත්, අනිවාර්යයෙන්ම මන්ත්‍රී කණ්ඩායම මෙහි නිරීක්ෂණයක යෙදිය යුතු බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:07** ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය

**07:07:01** කරවකැටිය උඩකන්දපාර කාණු පද්ධතිය පිළිසකර කිරිම.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසුයේ ඉහත යෝජනා කර ඇති මාර්ගය බෑවුම් සහිත ඉතා භයානක මාර්ගයක් බවත්, මෙහි බොහෝ මාර්ගවල කාණු පිරී ඇති බැවින් කාණුවල ජලය පාර දිගේ ගලාගෙන යන බවත්, එබැවින් හදලා තියෙන පාරත් කැඩිලා යන බවත්, හැකි ඉක්මනින් එම කාණුවල පස් වැලි ඉවත් කරලා කාණු පද්ධතිය පිළිසකර කර ලබාදෙන ලෙසත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:07:02** ක්ලින් ශ්‍රී ලංකා යටතේ කසල බාජන ලබා දීමට කටයුතු කරන්න.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඞී.වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඞී.වීරසිංහ මැතිතුමිය පැවසූයේ ක්ලින් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ සභාවෙන් ආයතනයක් සම්බන්ධ කරගෙන හෝ කසල බඳුන් ජනතාවට බෙදා දිය යුතු බවත්, එම කසල බඳුන් ක්‍රමවේදය ඉතාම සාර්ථක බවත්, කිසිඳු වෙලාවක එම කසළ බඳුන් පිරෙන්නේ නැති බවත්, ඒවා පස් වලට උරාගෙන ක්‍රමානුකූලව පොහොර බවට පත්වන බවත්, උඩකන්ද මාර්ගයේ ට්‍රැක්ටර් රථ ධාවනය කළ නොහැකි නිසා එම කසළ බඳුන් හෝ ජනතාවට ලබා දෙන ලෙසත්ය.මේ සඳහා ගරු සභාපතිතුමා පැවසූයේ පුද්ගලික ආයතනයක් මේ සම්බන්ධව කතා කළ බැවින් එම ආයතනය සමඟ සාකච්ඡා කර ඉදිරියේදි මේ සම්බන්ධව කටයුතු කරන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:07:03** බලන්ගොඩ තුඹගොඩ බස්නැවතුමේ ඇති කොට්ටම්බා ගස අනතුරුදායකයි, හැකි ඉක්මනින් අතු ඉවත් කිරිමට කටයුතු කරන්න.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඞී.වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඞී.වීරසිංහ මැතිතුමිය පැවසූයේ තුඹගොඩ මෙම ස්ථානය නිරීක්ෂණය කිරීම සුදුසු බවත්, එම ස්ථානය පාසල් ළමුන් නිතර ගැවසෙන ස්ථානයක් බවත්, ඒ අනුව ඉදිරිපස නිවසක අයෙකු කතාකර මෙය සභාපතිතුමාට පැවසීමේදී අතු ටික කපලා දෙන්නම් යැයි පවසා ඇති බවත්, ඒ අනුව විදුලි බල මණ්ඩලය දැනුවත්කර විදුලි රැහැන් ඉවත් කිරීමට කටයුතු කර මෙම අනතුරුදායක තත්ත්වය වැළැක්වීමේ කටයුතු ඉටුකරන ලෙස පැවසීමේදී, ගරු උපසභාපති නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ ඉදිරියේදී තුඹගොඩ ගුවන් පාලම ඉදිකිරීමේදී මෙම ගස ඉවත් වන බවයි.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඞී.වීරසිංහ මැතිතුමිය සඳහන් කළේ කලේ ඒවා කෙරෙන දිනයක් තවම නොදන්නා බැවින් මෙම අනතුරුදායක තත්ත්වය කඩිනමින් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ලබා ගන්නා ලෙසයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාද පැවසූයේ පාසල් දරුවන් වැඩි ප්‍රමාණයක් මෙහි රැඳෙන බවත්, චේන්සෝ යන්ත්‍ර දෙකක් සභාවට ගෙනවිත් තිබුණ බවත්

එම යන්ත්‍ර දෙකම සභාවේ පවතිනවාද යන්න දැනගත යුතු බවත්, ඒ අනුව දැන් ගබඩාවේ එම යන්ත්‍ර තිබේද යන්න පිළිබඳව විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ ඒ ගැන දැනුවත් නොමැති බවයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ එය රාජ්‍ය දේපළක් බවත්,එක් යන්ත්‍රයක් හදන්න දාලා වේයෝ කාල තියෙද්දි අහපුවම ගෙනාව බවත්, නමුත් මුදල් දුන්නේ නෑ කියලා එම හදන්න දීපු පුද්ගලයාම ආපසු එය රැගෙන ගොස් ඇති බවට ආරංචියක් පවතින බවත්, ඒ අනුව එම චේන්සෝ දෙක පෙන්නන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ජේමදාස මැතිතුමා පැවසුයේ එම යන්ත්‍ර ආපදා කළමනාකරණ ඒකකයෙන් ලබාදී ඇති බවයි. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ ආපදා කළමනාකරන ඒකකයෙන් ලබා දී ඇති බවත් එයින් ලොකු කඹයක් එමෙන්ම විදුලිය නොවදෙන ඉනිමගක්ද ලබා දී ඇති බවත්, ඒ අනුව ඒවා ගබඩාවේ තිබේද යන්න පිළිබඳව බලන ලෙසත්ය. ඒ අනුව එතුමා වැඩිදුරටත් පැවසුවේ සභාපතිවරයා ලෙස නියෝගයක් ලබාදී එම භාණ්ඩ ගබඩාවේ තිබේද යන්න පරීක්ෂා කර බැලිය හැකි බවත්, නයා පෙනේ පුප්පන්නෙ නැතුව හිටපුවාම දර වලටත් ගන්නවා කියලා කතාවක් තියෙනවා එසේ නැතිනම් ඒ විදියට වෙන බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:08** ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා

**07:08:01** මොහාන් සාලිය එල්ලාවල මාවතේ තිබෙන ස්වාභාවික ජල උල්පතෙන් ජලය ලබා ගන්නා පරිශ්‍රය නවීකරණය කිරීම.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පැවසුයේ මෙම ජල උල්පත තිබෙන ස්ථානයේ නවීකරණය කරලා පිරිසිදුව එම ස්ථානයෙන් ජනතාවට ජලය ලබාගත හැකි පරිදි සකස් කරන ලෙස තමන් යෝජනා කරන බවත්, තම සහෝදරයාගේ මූල්‍ය පරිත්‍යාගයෙන් මෙම ස්ථානයේ විදුලි බල්බයක් දැමූ බවත්, නමුත් දැන් එය නොමැති බවත්, ඒ පිළිබඳව සොයා බලන ලෙසත්, පසුගිය දිනක පැවැති ශ්‍රමදානයේදී මෙම ස්ථානය තමන් සහ මාලක මන්ත්‍රීතුමා පිරිසිදු කළ බවත් එහිදී එම ස්ථානයේ කියන්න බැරි දේවල්ද තිබුණු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ රාත්‍රී කාලයේදී වාහන නවත්වා පුද්ගලයන් තමන්ගේ ශාරීරික අවශ්‍යතා ද මෙම ස්ථානයේ ඉටුකරගන්නා බවත් ,එමෙන්ම මෙම ස්ථානයට කසළද ගෙනවිත් දමන බවත්, මෙම යෝජනාව ඉතා හොඳ යෝජනාවක් බවත් කඩනමින් ඉටු කර දෙන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසුයේ තමන් පළමු සභා වාරයේදීම මෙම ස්ථානයෙන් අපතේ යන ජලය පොළ භූමියට රැගෙන ඒමට යෝජනා කළ බවයි. ගරු සභාපතිතුමා පැවසුයේ පසුගිය සතියෙත් මාර්ග සංවර්ධන අධිකාරිය කාණු පිරිසිදු කිරීම් සම්බන්ධව දැනුවත් කළ බවත්, ඒ අනුව මුළු නගරයේම කාණු පද්ධති පිරිසිදු කරන බව පැවසූ බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:09 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා**

**07:09:01** මුගුණමලේ පාර ආරම්භක කොටසේ නිවාස වලින් බැහැර කරන වැසිජලය නිසා පාරේ ගමන් කරන මගීන් විශාල අපහසුතාවයට පත්වන බැවින් ඒ සඳහා ක්‍රමවත්ව ජලය බැසයාමට කාණු පද්ධතිය සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසුයේ, මුගුණමලේ පාර ආරම්භක කොටසේ ටයර් කඩේ ළඟින් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කාණුවක් සකස් කර තිබුනද එතනින් ඉදිරියට විධිමත් කාණු පද්ධතියක් නොමැති බවත්, තිබෙන එකද නඩත්තුවක් නොමැති බවත්, එම ස්ථානය උප සභාපතිතුමා සමඟ නිරීක්ෂණය කළ බවත්, එයින් ඉදිරියට නිවෙස් තුනක් පවතිනවා එම නිවෙස් තුනටම ජලය පිට කිරීමට කිසිඳු ක්‍රමයක් නොමැති බවත්, එබැවින් පාර දිගේ ජලය ගලා යන බවත්,එබැවින් එම ස්ථානයට බොක්කුවක් යෙදීමට තමන් යෝජනා කරන බවත්ය.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ එම නිවෙසියන් කිහිපදෙනා කාණුව සකස් කර ගැනීමට කැමති බවත්, එයට බෝක්කුවක් යෙදීම සභාව මඟින් සිදු කර දෙන ලෙස ඔවුන් ඉල්ලීමක් සිදු කරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ පාර හරහා බෝක්කුවක් යෙදීමට අවශ්‍ය නොවන බවත්, එම ස්ථානයේ බුදු පිළිමය ළඟ බෝක්කුවක්

පවතින බවත් එය යට වී ඇති බවත්, ඉහත මන්ත්‍රීතුමා පවසන නිවෙස්වල ජලය බැස යාමට බෝක්කුවක් තියනවා එය තිබෙන්නේ බුදු පිළිමය ළඟ යටවී බවත්, එය හිරවී පවතින බවත්, ඒ අනුව එය පිළිසකර කලොත් ගඟට යැවිය හැකි බවත්, තමන් දන්නා ලෙසට සිප්යානා ළඟ සිට ජයන්ත මහතාගේ නිවෙස අසළ බෝක්කුවක් පවතින බවත්, ඉත්තැගලහේන මාර්ගයේ ජලය බැස යාමටද එතනින් සකස් කළ හැකි බවත්, ආලෝක මහත්මාගේ ගොඩනැගිල්ලෙහි ජලයද බැස යාමටද එම නිවෙස පසු කළ විට බෝක්කුවක් පවතින බවත්, දොරවෙල සිට එනවිට කොට්ටගහ ළඟ පවතින පරණ බෝක්කුව සුද්ද කරානම් එයින්ද ජලය බැසයන බවත්, ඉන් ඉදිරියට අලුතෙන් ව්‍යාපාරික ස්ථාන 04ක් ඉදිවී ඇති බවත්, එහි ඉදිරිය සම්පූර්ණයෙන්ම කොන්ක්‍රීට් කර ඇති බවත්, ඒ අනුව එම ස්ථානයේ කාණු පද්ධතිය සම්බන්ධයක් නොමැති බවත්, ඒ සම්බන්ධවද බැලිය යුතු බවත්, ඉන් එහාටද නව ගොඩනැගිල්ලක් ඉදි කිරීමට භූමිය කැපීමේදී ගඟට පස්ටික දාන්න යද්දි හිටපු සභාපතිතුමාට පවසා එය වළක්වා ගත් බවත් එතනත් කාණු පද්ධතිය නොමැති බවත්, ඒ අනුව මෙහි දිගටම කාණු පද්ධතිය සකස් කිරීමට වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවත්ය.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:10** **ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**07:10:01** දැනට බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව තිබෙන ට්‍රැක්ටර් බවුසර් නගර සභාව වෙත ලබාදීමට එකග වී ඇති බැවින් එය නගර සභාව වෙත ලබාගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.** **කාරක සභා වාර්තා සලකා බැලීම**

2026.05.12,2026.05.18,සහ 2026.06.02 යන දිනයන්හි පැවති මුදල් කාරක සභා වාර්තා සහ 2026.05.22 දිනැති පරිසර සෞඛ්‍ය හා සණඅපද්‍රව්‍ය කළමණාකරණ කාරක සභා වාර්තාව මෙදින ගරු සභාවට ඉදිරිපත් කළ අතර විරෝධතා නොවූ හෙයින් එකී වාර්තා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**09. ආදායම් වියදම් වාර්තා සලකා බැලීම**

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා පැවසුවේ 2026.04.07 දිනැති සභා වාර්තාවේ විනෝද බදු ලෙස රු.50,000.00ක් ලෙස පිළිතුරු ලබා දුන්නද මෙවර ලබා දී ඇති ආදායම් වියදම් වාර්තාවේ විනෝද බදු ලෙස දක්වා ඇත්තේ රු.10,250.00මුදලක් බවත් ඒ අනුව එය දිගින් දිගටම ඉදිරියට ගෙනෙමින් තිබෙන බවත්, නිවරදි තොරතුරු ලබා දෙන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ 2026.05.18 දිනැති මුදල් කාරක සභාවේ දී 37-7933 දරණ ට්‍රැක්ටර් රථයට අදාළව රුපියල් 253,950.00ක බිල් පතක් අනුමත කරද අද වෙනතුරුත් එම ට්‍රැක්ටරය ධාවන තත්ත්වයේ නොමැති බවත්, 1118 දරණ ට්‍රැක්ටරයට එන්ජින් ඔයිල් ලීටර් 25ක්ද, 2600 ට්‍රැක්ටරයට එන්ජින් ඔයිල් ලීටර් 29ක්ද දමා ඇති බවත්, එකවරකට එන්ජින් ඔයිල් ලීටර් 25 ක් දානවා නම් මේ ගැන මේ වනතෙක් බලලම නැති බවත්, මෙලෙස සිදුවනවානම් මේ පිළිවදව සොයා බැලිය යුතු බවත්, සර්විස් වලදී එන්ජින් ඔයිල් දාන්නෙම නැද්ද යන්නත්ය.

ගරු උපසභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුවේ මේ සම්බන්ධව වැඩ අධිකාරී මහතාගෙන් කරුණු පැහැදිලි කිරීමක් සිදුකර ගැනීම සුදුසු වන බවයි.ඒ අනුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් සහ ගරු උපසභාපති නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කළ අතර වැඩ අධිකාරී මහතා කරුණු පැහැදිලි කර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් සහ ගරු උපසභාපති නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**2026 අප්‍රේල් මස ආදායම් වියදම් වාර්තාව**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | රු.14,477,523.05 |
| මූලධන ලැබීම් | රු.2,686,528.87 |
| වෙනත් ලැබීම් | රු.2,483,732.97 |
| මුළු ලැබීම් | රු.19,647,784.89 |
| පුනරාවර්තන වියදම් | රු.14,143,419.83 |
| ප්‍රාග්ධන වියදම් | රු.673,107.45 |
| වෙනත් වියදම් | රු.11,386,196.01 |
| මුළු වියදම් | රු.26,202,723.29 |

**2026 මැයි මස ඉන්ධන වාර්තාව**

| 2026 මැයි ඉන්ධන වාර්තාව | |
|---|---|
| වාහන අංකය | මුදල (රු) |
| 226-7521 | 7840.00 |
| 227-5020 | 56,416.78 |
| 56-1906 | 14,119.84 |
| BC 0005 | 59,160.00 |
| GC 0001 | 53,232.00 |
| GK 1483 | 175,112.66 |
| JD 4684 | 6154.92 |
| ND 5124 | 43,122.74 |
| ZA 5039 | 15680.00 |
| MM 8152 | 2050.00 |

| | |
|---|---|
| PF 4006 | 45,083.92 |
| RC 1107 | 67,112.70 |
| RC 1118 | 112,853.57 |
| RD 8000 | 114,106.07 |
| ZA 9835 | 100,718.66 |
| QL 2901 | 6261.52 |
| UQ 1933 | 3280.00 |
| 37-7933 | 3920.00 |
| HF 8558 | 50,672.50 |
| HF 8952 | 15,680.00 |
| **TOTAL** | **952,577.88** |

2026/05/31 දිනට ගබඩාවේ ඉතිරි ඉන්ධන රු.208,469.00

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ පසුගිය 28 වෙනිදා පැවති තමන්ගේ ආගමික උත්සවයට ඒ කටයුතු පිළිබඳව නගර සභාවේ මන්ත්‍රී මණ්ඩලය,කාර්යය මණ්ඩලය,විශේෂයෙන්ම මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා පූර්ණ සහයෝගය ලබා දුන් බවත් එතුමා එම අවස්ථාවේදී ඉතා සුහදව, නීත්‍යානුකූලව, ඉතා නිවරදි ආකාරයට සියලු ගවයන් ටික පරීක්ෂා කරලා, නීත්‍යානුකූලව කටයුතු සිද්ධ වුන බවත්, ඒ අනුව තමාගේ භාරකාර මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු සියලුම මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් සභාවේ ගරු සභාපතිතුමා,උප සභාපතිතුමාටත්, ලේකම්තුමිය ඇතුළු සියලුම නිලධාරීතුමන්ටත් මේ අවස්ථාවේදී ස්තූතිවන්ත වන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් පසුගිය මස සම්පත් පියස කඩ කාමර බදු දීමේදී එම කඩ කාමර බදු ලබාගත් පුද්ගලයන්ම ඒවා කරනවාද යන්න පිළිබඳව ගැටළුවක් පවතින බවත්, ඒවා නැවත කුලියට ලබාදීමක් සිදුවන බවත්,එක් පුද්ගලයෙක් තමන්ට ලංකා බැංකුව ඉදිරිපිට, බස් නැවතුම්පොලේ කඩ තිබියදී මෙයිනුත් කඩ කාමරයක් ලබා ගත් බව පැවසූ බවත්, එය රු.40,000ක කුලියකට වෙනත් අයෙකුට ලබා දුන් බව පැවසූ බවත්,ඔහුට මෙහි කඩ කාමර 04ක් පමණ තිබෙන බව පැවසූ බවත්, ඒ පිළිබඳව සොයා බලන ලෙසත්, සභාවට එන ආදායම් මෙලෙස අපතේ යන බවත්, සභාවේ ආදායම් නෑ කියලා හැමදාම පවසන බවත්, එම පුද්ගලයන් කැඳවා මේ පිළිබඳව විමසීම් කරන ලෙසත්, ඊළඟ සභාව වෙනතෙක් නොසිට මේ සඳහා මේ සඳහා දැන්මම ක්‍රියාත්මක විය යුතු බවත්, උප සභාපතිතුමා පැවසූ පරිදි තුඹගොඩ කොට්ටම්බා ගස කැපීමට ගුවන් පාලම හදනකල් නොසිට එය සිදුකරන ලෙසත්,ඔය ආකාරයෙන් එන ව්‍යාපෘති ක්‍රියාත්මක වනවාද යන්න නොදන්නා බවත්, රෝහලේ ගැටළු ටික ගැන දැනුවත් කරා එම කටයුතු තවම සිදු වී නොමැති බවත් පවසමින් එතුමියගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා අදහස් දක්වමින් කසළ එකතු කිරීම සඳහා ත්‍රීරෝද රථයක් මිලදීගැනීමට සභා අනුමැතිය ලබාගෙන ඉහළට යොමුකළ බවත්, නමුත් එවැනි ලිපියක් පළාත් පාලන අමාත්‍යාංශයට ගිහින් නොමැති බවත්, විෂයභාර නිලධාරින්ට ඒ පිළිබඳව කතා කළ බවත්, ට්‍රැක්ටර් ධාවනය කළ නොහැකි මාර්ග සඳහා එම විකල්පය අත්‍යවශ්‍ය බැවින් ඒ පිළිබඳව සලකා බලන ලෙසත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා අදහස් දක්වමින් සභාවේ පෞද්ගලික කාරණා වෙනුවෙන් කිසිඳු දෙයක් බලාපොරොත්තු නොවන බවත්, ඒ අනුව සභා වාර කිහිපයකදීම වැඩ අධිකාරී මහතාගේ වැඩ කොටස වැඩිනම් ඒ වාහන සම්බන්ධ වගකීම වෙනත්

නිලධාරීයෙකුට පවරන ලෙස පැවසූ බවත්, එසේම හැමවෙලේම මුදල් පිළිබඳව කතා කරන බැවින් ඊට දැන් තිබෙන නව තාක්ෂණය යොදා ගත යුතු බවත්, සාමාන්‍යයෙන් මිනිස්සු ගත්තම හොරකම් කරන බවත්,ඒ අනුව මේවාට හරියටම ඉලක්ක කරලා අදාළ තාක්ෂණය යොදා ගත යුතු බවත්, එමෙන්ම පසුගියදා පැවති වෙසක් කලාපයේදී සභාවේ සියළු දෙනා දිවා රෑ නොබලා නොමසුරුව දායකත්වය ලබාදුන් බවත්, ඒ පිළිබඳව ස්තූතිය පල කරන බවත් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් චේන්සෝ එක සම්බන්ධව සභාව ඉවරවෙන්න කලින් ඒ සඳහා පිළිතුරක් ලබා දෙන ලෙසත්, නිශ්ශබ්දතාවයෙන් පෙනී යන්නේ චේන්සෝ එකට ගුල්ලෝ ගහලාද යන්නත්, තමන් මෙතෙක් පැවසූ කතා එකක්වත් බොරු නොවන බවත්, චේන්සෝව ගෙනවිත් භාර දි ඇත්තේ ගබඩා භාර නිලධාරීයාට බවත්, අප්‍රේල් මස සභාවේදී මෙහි පාන්දර 1.10ට තෙල් බාපු කතාව පැවසූ බවත්, මුදල් කමිටුවේදී මේ පිළිබඳව විමසීමේදී මේ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ගය ලෙස පැවසූයේ අදාළ රියදුරන් මාරු කිරීම බවත්, තමන් කුමක් හෝ පෙන්වා දීමේදී එම තොරතුරු තමන්ට ලබා දෙන්නේ කව්ද යන්න මෙහි සොයන බවත්, එසේ නොකර ඒ සම්බන්ධව නිවරදි ක්‍රියාමාර්ග ලබා ගන්නා ලෙසත් පවසන ලදී.

**ගරු උපසභාපති නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු උපසභාපති නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ කොම්පෝස්ට් අංගනයට නව යන්ත්‍රයක් ඉල්ලා ඇති බැවින් ඒ සම්බන්ධ කටයුතු කඩිනම් කරන ලෙසයි.

මෙම අවස්ථාවේදී සභාවේ චේන්සෝ යන්ත්‍ර පිළිබඳව විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කරන ලදී.

**11. අවසානය**

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා ස්තුතිය පුද කරන බව දන්වමින් මෙදින මහ සභාවේ කටයුතු ප.ව.02.15 ට පමණ අවසන් කරන ලදි.

එන්.ඩබ්.පී.ටී ජයසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.